**ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා වෙත ඉදිරිපත් කරනු ලබන, අපරාධ සහ අපරාධ විමර්ශනවලට අදාළ ව එකතු කරගනු ලබන සහ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ (නඩු භාණ්ඩ) කඩිනමින් බැහැර කිරීම සම්බන්ධයෙන් වන නිරීක්ෂණ සහ නිර්දේශ**

අවසාන වාර්තාව

අපරාධ සහ අපරාධ විමර්ශනවලට අදාළ ව එකතු කරගනු ලබන සහ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ (නඩු භාණ්ඩ) කඩිනමින් බැහැර කිරීමට අදාළ ක්‍රමවේද ඇතුළත් ප්‍රතිපත්තිමය සහ නෛතික රාමුව පිළියෙල කිරීම සහ ඊට ආනුෂංගික වෙනත් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන කමිටුව

**2023** ජුලි මස **12** වැනි දින

# පසුබිම

පවතින නෛතික ප්‍රතිපාදන සහ ක්‍රමවේද හේතුවෙන් අධිකරණවලට ඉදිරිපත් කරනු ලබන බොහෝමයක් නඩු භාණ්ඩ අනුරූප නඩු විභාග අවසාන වනතෙක් සහ ඉන් අනතුරුවත්, අධිකරණ පරිශ්‍ර තුළ තබා ගැනීමට සිදු වන හෙයින්, ප්‍රායෝගික අපහසුතාවන් සහ අක්‍රමිකතා හට ගන්නා බව පැහැදිලිය. තව ද, කඩිනමින් බැහැර කළ හැකි ඇතැම් ද්‍රව්‍ය, එසේ බැහැර නොකරන අවස්ථා ද ඇත. ඇතැම් ද්‍රව්‍ය පරිසරයට නිරාවරණය වීම හේතුවෙන්, සම්පූර්ණයෙන් ම විනාශ වන අවස්ථා ද ඇත.

පවතින තත්ත්වය යටතේ නඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් විවිධ අධිකරණ පරිශ්‍රයන්හි, පොලිස් ස්ථානවලත්, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව තුළත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඇතුළු වෙනත් විවිධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන තුළත් පවතින බව කමිටුවේ නිරීක්ෂණයට ලක් ව ඇත. ඒ හේතුව නිසා, එම අධිකරණ සහ එකී රාජ්‍ය ආයතනවලට ද ප්‍රායෝගික දුෂ්කරතාවයන්වලට මුහුණ පෑමට සිදු ව ඇත. මේ අතුරින් ඇතැම් නඩු භාණ්ඩ පරිසරයට නිරාවරණය ව පැවතීම තුළින් නිරපරාදේ විනාශ වන බව කමිටුව නිරීක්ෂණය කර ඇත. මෙම තත්ත්වය තුළින් ඉමහත් නාස්තියක් සිදු වන බව කමිටුවේ මතයයි. මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ ප්‍රමාණවත් ඉඩකඩ සහ ගබඩා කිරීමේ පහසුකම් නොමැති වීමයි.

මෙම නඩු භාණ්ඩ අනුරූප නඩු විභාගය අවසාන වනතෙක් අධිකරණය භාරයේ තබා ගැනීමත්, නඩු විභාගය අවසාන වීමට ප්‍රථම බැහැර කිරීමට ඉඩ සලස්වන සහ දිරිගැන්වෙන ආකාරයේ නිශ්චිත නෛතික ප්‍රතිපාදන, නිර්ණායක සහ ක්‍රමවේද වර්තමානයේ නොමැති වීමත්, මෙම තත්ත්වයට හේතු සාධක වී ඇති බව පෙනී යයි.

එසේ හෙයින්, පවතින තත්ත්වය සහ එමගින් ඇති ව තිබෙන ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කොට, නිසි ලෙස යුක්තිය පසිඳලීමේ අවශ්‍යතාවයනට හානියක් නොවන පරිද්දෙන්, එම ද්‍රව්‍ය අතුරින් කඩිනමින් බැහැර කිරීමට හැකියාවක් තිබෙන නඩු භාණ්ඩ, අප්‍රමාදව බැහැර කිරීම සඳහා අවස්ථාවෝචිත සහ කාර්යක්ෂම ක්‍රමවේදයක් ඇති කිරීමට අවශ්‍ය යෝජනා නිර්දේශ කිරීම පිණිස විශේෂ කමිටුවක් ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ආචාර්ය, ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මැතිතුමන් විසින් 2022 ජූනි මස දී පත් කරන ලදී.

කමිටුව වෙත පවරන ලද කාර්යය පිළිබඳ මූලික අධ්‍යයනයක් කිරීමෙන් අනතුරුව, 2022 නොවැම්බර් මස 23 වන දින ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමන් වෙත ඒ සම්බන්ධයෙන් අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. මෙහි අන්තර්ගත වන්නේ, මෙම කමිටුවේ අවසාන සහ පූර්ණ වාර්තාවයි. මෙයට අතුරු වාර්තාවේ අන්තර්ගත නිර්දේශ ද ඇතුළත් කොට ඇත.

**කමිටුවේ සාමාජිකයන්:**

- ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ - සභාපති
- ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ප්‍රියන්ත නාවාන මහතා - නීතිපති දෙපාර්තමේන්තුව - (ගරු නීතිපති තුමාගේ පළමු වන නියෝජිත)
- ජනාධිපති නීතිඥ කුවේර ද සොයිසා මහතා
- ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා
- ජනාධිපති නීතිඥ නෙවිල් අබේරත්න මහතා
- නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා - නීතිපති දෙපාර්තමේන්තුව - (ගරු නීතිපති තුමාගේ දෙවන නියෝජිත)
- නීතිඥ සංජය ගමගේ මහතා - (ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිත)
- නීතිඥ අමල් ඒ. රන්දෙනිය මහතා
- නීතිඥ චතුර ගල්හේන මහතා
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ කමල් සිල්වා මහතා - ශ්‍රී ලංකා පොලීසිය - (පොලිස්පති වරයාගේ පළමු වන නියෝජිත)
- නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අසංග කරවිට මහතා - ශ්‍රී ලංකා පොලීසිය - (පොලිස්පති වරයාගේ දෙවන නියෝජිත)
- ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක සන්ධ්‍යා රාජපක්ෂ මහත්මිය - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - (ආණ්ඩුවේ රස පරීක්ෂක තුමියගේ නියෝජිත)
- සහකාර නීති කෙටුම්පත් සම්පාදක ලංකිකා දයාරත්න මෙනවිය - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව - (නීති කෙටුම්පත් සම්පාදක තුමියගේ නියෝජිත)
- සහකාර ලේකම් (නීති) රුවනදිනි කුරුප්පු මහත්මිය - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - කමිටුවේ ලේකම්

මෙම කමිටුවේ රැස්වීම් අවසාන වෙමින් පවතින අවස්ථාවේ දී මෙම කමිටුවට ම අපරාධ සිදු කිරීමෙන් සෘජු ලෙස සහ අනීතිකව උපයා ගනු ලබන දෑ (Proceeds of Crime) පිළිබඳ විශේෂිත නීතියක නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුව නිර්මාණය කිරීමේ වගකීම ගරු අමාත්‍යවරයා විසින් පවරන ලද අතර, ඒ සඳහා මෙම කමිටුවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජිතයෙක් ද පත් කරන ලදී. ඒ අනුව, එම කොමිෂන් සභාව වෙනුවෙන් පත් කරන ලද නියෝජිත වූ සහකාර අධ්‍යක්ෂක ජනරාල් දිස්නා ගුරුසිංහ මහත්මිය හට මෙම කමිටුවේ විෂයය ක්ෂේත්‍රය ගැන තිබෙන අවබෝධය සැලකිල්ලට ගෙන මෙම කමිටුවේ රැස්වීම්වලට ද සහභාගී වන ලෙස කමිටුව විසින් ආරාධනය කිරීමෙන්, මෙම කමිටුවේ අවසාන රැස්වීම් ත්‍රිත්වයට ද ඇය සහභාගී වන ලදී.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා නිලධාරිනී දිනුෂිකා මදූෂානි මහත්මිය කමිටුවේ පරිගණකගත යතුරු ලියන කටයුතු සිදු කරන ලදී.

## කමිටුවේ කාර්යය පටිපාටිය

කමිටුවෙහි පළමු රැස්වීම 2022.08.03 වන දින පැවැත්වීමෙන් අනතුරුව එළඹි එකඟතාවය අනුව, ඉන් පසු සෑම සතියකම බදදා දිනයන්හි දී පස්වරුවේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ යී ය ශ්‍රවණාගාරයේ දී රැස් වූ කමිටුව, මේ වන විට රැස්වීම් වාර 30ක කටයුතු සිදු කර ඇත.

මේ අනුව කටයුතු සිදු කිරීමේ දී, කමිටුව විසින් සුවිශේෂී අවස්ථාවන්හි දී පස්වන (05) සහ හයවන (06) භාණ්ඩ කාණ්ඩ වැනි විශේෂ කාණ්ඩයන් සම්බන්ධයෙන් වන සාකච්ඡාවන්හි දී, එකී ක්ෂේත්‍රයන් තුළ විශේෂඥයින් වන පහත නම් සඳහන් කොට ඇති විශේෂඥයින් කමිටු රැස්වීම් සඳහා ආරාධනා කොට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් සහ අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

- අධිකරණ වෛද්‍ය නිලධාරි, විශේෂඥ වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා

  විශේෂඥ වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා, වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් 1988 වර්ෂයේ දී, වෛද්‍ය වෘත්තියට පිවිස වර්තමානයේ දී කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ලෙස සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබයි. යුක්‍රේනයේ විනිට්සා රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ඇති ඔහු, අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ කොළඹ වෛද්‍ය පීඨයේ ගරු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යකු ලෙස සේවය කරනු ලබයි.

- ආචාර්ය රුවන් ජේ. ඉලේපෙරුම මහතා

  ආචාර්ය රුවන් ජේ. ඉලේපෙරුම මහතා ව්‍යවහාරික ඩී.එන්.ඒ. තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාවේ සිටින වඩාත් පළපුරුදු සහ සුදුසුකම් ලත් විද්‍යාඥයා වේ.

  ඔහු **Genetech** ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥවරයා ලෙස වසර 18 කට වැඩි කාලයක් අපරාධ විමර්ශනයේ දී පුද්ගල හඳුනාගැනීමේ විශේෂඥයෙකු ලෙස සේවය ඇති අතර, දැනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරක් දරයි. ආචාර්ය රුවන් ජේ. ඉලේපෙරුම මහතා **Genetech** ආයතනයෙහි සේවය කරන කාලය තුළ සියලු ප්‍රමුඛ පෙළේ නඩු වන විනිසුරු සරත් අඹේපිටිය නඩුව, රෝයල් පාක් ඝාතන නඩුව, සේයා සඳෙව්මි ඝාතන නඩු සහ කොටකෙතන ඝාතන දාමය යන නඩු දාමයක ඩී.එන්.ඒ. පරීක්ෂණ ඇතුළුව අපරාධ නඩු 4600 කට වැඩි ප්‍රමාණයක් හසුරුවා ඇත.

  ඔහු ඇමරිකානු **Fulbright** ශිෂ්‍යත්ව ලාභියකු වනඅතර ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික ඩී.එන්.ඒ. පදනම්වූ අණුක මානව විද්‍යාව පිළිබඳව ඔහු විසින් සිදුකරන ලද පර්යේෂණය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ,ඇත්තේය. ආචාර්ය රුවන් ජේ. ඉලේපෙරුම මහතා විශ්වවිද්‍යාල ගණනාවක, ජාතික පොලිස් ඇකඩමිය හා පොලිස් විද්‍යාලයහි ක්‍රියාකාරී කථිකාචාර්යවරයෙකු ලෙසත් ඩී.එන්.ඒ. මත පදනම් වූ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ලේඛකයෙකු ලෙසත් පුළුල් ලෙස මෙම ක්ෂේත්‍රයේ කටයුතු සිදුකොට ඇත .

ඔහු අපරාධ විමර්ශනවල ඩී.එන්.ඒ. සාක්ෂි පිළිබඳ පොත් කිහිපයක කතුවරයා වන අතර ජානමය පෙළපත්, ශ්‍රී ලංකාවේ ජනගහනයේ අණුක මානව විද්‍යාව සහ සත්ව චෝහාරික පිළිබඳත් ක්‍රියාකාරී පර්යේෂකයෙකි. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික කණ්ඩායම් සහ ආදිවාසී වැද්දන්ගේ ජාන පිළිබඳ ඔහුගේ පර්යේෂණ සොයාගැනීම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

- **ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක වනිතා ජේ. බන්ඩාරනායක මහත්මිය**

  රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, වසර 29 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නියෝජ්‍ය රස පරීක්ෂක වී.ජේ. බණ්ඩාරනායක මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ ව විද්‍යාවේදී විශේෂ උපාධිය ගෞරව සහිතව සමත් ව එම විශ්ව විද්‍යාලයේ ම විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ ව පශ්චාත් උපාධිය හදාරා ඇත. ඇය ඉන්දියාවේ අපරාධ විද්‍යා සහ අධිකරණ වෛද්‍ය විද්‍යා පිළිබඳ ජාතික ආයතනයේ (නව දිල්ලිය) අධිකරණ මස්තු විද්‍යා, ජීව විද්‍යා සහ ඩී.එන්.ඒ. තාක්ෂණය පිළිබඳ ව පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව ද, ඇමරිකා එක්සත් ජනපදයේ ඔක්ලහෝමා රාජ්‍ය විශ්ව විද්‍යාලයේ අධිකරණ මස්තු විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ඩී.එන්.ඒ. ඇඟිලි සලකුණු තාක්ෂණ පිළිබඳ ව වසර දෙකක විශේෂ පුහුණු පාඨමාලාවක් ද හදාරා ඇත. මීට අමතර වශයෙන් ඇය විසින් මෙම විෂය සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ සහ දකුණු කොරියාවේ ද රජයේ ආයතනවල දී පුහුණු පාඨමාලා හදාරා ඇත.

මෙම අවසන් වාර්තාව පිළියෙල කොට අවසන් කරන තුරු, හඳුනා ගන්නා ලද නඩු භාණ්ඩ කාණ්ඩ අට (08) අතුරින්, ප්‍රමුඛතා පදනම මත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබිය යුතු බවට කමිටුව විසින් විශේෂයෙන් එකඟ වන ලද පළමු වන නඩු භාණ්ඩ කාණ්ඩය වන “අපරාධ සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය (Items used to commit crimes) [උදා: අවි ආයුධ, මෙවලම්, යන්ත්‍රෝපකරණ, පරිගණක ඇතුළු විවිධ උපකරණ සහ මෝටර් රථ ඇතුළු සියලු ම වර්ගවල වාහන]” යන කාණ්ඩය සම්බන්ධයෙන් වන 2022 නොවැම්බර් මස 23 දිනැති අතුරු වාර්තාව ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමන් වෙත ඉදිරිපත් කිරීමට කමිටුව විසින් කටයුතු සිදු කරන ලදී. එකී අතුරු වාර්තාවෙහි අන්තර්ගත නිර්දේශ ගරු අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කොට, එහි අන්තර්ගත ප්‍රතිපත්ති සහ මූලධර්මවලට අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව යෝජිත නීතිය කෙටුම්පත් කිරීම ආරම්භ කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව කමිටුවට දන්වා ඇත.

තව ද, මෙම වාර්තාවේ නඩු භාණ්ඩ වර්ගීකරණය යටතේ, 4 වන භාණ්ඩ කාණ්ඩය ලෙස හඳුන්වා ඇති එනම්, අපරාධ සිදු කිරීමෙන් ඍජු ලෙස සහ ද්විතියිකව උපයාගනු ලබන දෑ (Proceeds of Crime) යන භාණ්ඩ කාණ්ඩය සම්බන්ධයෙන් විශේෂිත නෛතික රාමුව පිළියෙල කොට, එම නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් වෙන ම වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් දන්වන ලදී. අනතුරුව, ඒ සඳහා බොහෝ සෙයින් මෙම කමිටුවෙහි සාමාජිකත්වයෙන් සමන්විත වෙනත් කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුවේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇත.

## කමිටුව විසින් නිර්දේශිත නෛතික සහ ප්‍රතිපත්ති රාමුව


| අන්තර්ගත කරුණු | පිටු අංකය |
|---|---|
| නඩු භාණ්ඩ හැඳින්වීම සහ වර්ගීකරණය | 9-10 |
| 1. භාණ්ඩ කාණ්ඩ අංක 1<br>අපරාධ සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය (Items used to commit crimes) [උදා: අවි ආයුධ, මෙවලම්, යන්ත්‍රෝපකරණ, පරිගණක ඇතුළු විවිධ උපකරණ සහ මෝටර් රථ ඇතුළු සියලු ම වර්ගවල වාහන] | 11 |
| 1.1 නිරීක්ෂණ:-<br>1. කවුරුන් විසින් මෙම භාණ්ඩ සන්තකයට ගනු ලබන්නේ ද යන වග<br>2. මරණ පරීක්ෂණ පවත්වන මහේස්ත්‍රාත්වරුන්ගේ නියෝග ප්‍රකාර ව සන්තකයට ගනු ලබන ද්‍රව්‍ය<br>3. විශේෂඥයින්ගේ උපදෙස් ප්‍රකාරව සන්තකයට ගනු ලබන ද්‍රව්‍ය<br>4. භාණ්ඩ සන්තකයට ගනු ලැබීමෙන් අනතුරුව ඒවාට සිදු වන දේ<br>5. ව්‍යවහාරික විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව මෙම භාණ්ඩවලට සිදුවන දේ<br>6. භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධ නියෝග පිළිබඳ වත්මන් තත්ත්වය | 11-12 |
| 1.2 කමිටුවේ නිර්දේශ:-<br>මුඛ්‍ය පරමාර්ථය<br>1. නව නීතියක අවශ්‍යතාවය<br>2. මූලික සිද්ධාන්තය සහ ව්‍යාතිරේඛී අවස්ථා<br>3. නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් කුමන භාණ්ඩ ස්වකීය සන්තකයට ගත යුතු ද යන වග<br>4. සන්තකයට ගනු ලබන සහ ගනු නොලබන භාණ්ඩවල සවිස්තරාත්මක වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන පිළියෙල කිරීම<br>5. සවිස්තරාත්මක වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන පිළියෙල කිරීමේ කාර්යය පටිපාටිය<br>6. භාණ්ඩ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය භාරයේ සුරක්ෂිතව තබා ගැනීම<br>7. ඉසව්ගත භාණ්ඩ සමඟ අනුරූප සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන අධිකරණයට ඉදිරිපත් කිරීම<br>8. ව්‍යවහාරික විමර්ශන විශේෂඥයින් වෙතට නඩු භාණ්ඩ සමඟ සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප, වීඩියෝ රෙකෝඩන ඉදිරිපත් කළ යුතු බව<br>9. නඩු භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝග නිකුත් කිරීමේ ක්‍රමවේදය<br>10. නඩු භාණ්ඩ වන වාහන සහ යන්ත්‍රෝපකරණ සම්බන්ධ විශේෂ කාර්යය පටිපාටිය<br>11. අවි ආයුධ, ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය<br>12. භෞතික සාක්ෂිවලට වෛකල්පිතව සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන ඉදිරිපත් කිරීම | 13-25 |

13. ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල ආවේශ්‍යතාවයට සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන අදාළ නොවන බව
14. ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල ආවේශ්‍යතාව තීරණය කිරීමේ අභිමතය
15. වරදවල් සිදු කිරීමට භාවිතා කර තිබෙන පරිගණක, ජංගම දුරකථන ඇතුළු ඉලෙක්ට්‍රොනික උපකරණ විෂයෙහි අනුගමනය කළ යුතු විශේෂ කාර්යය පටිපාටිය

2. භාණ්ඩ කාණ්ඩ අංක 2 25

යම්කිසි අපරාධයක් සිදු කරන ලද්දේ යම් ද්‍රව්‍යයක් විෂයෙහි නම්, එවැනි ද්‍රව්‍ය (Items in respect of which crimes have been committed.) [උදා: මුදල්, දැව, මැණික්, සොරකම් කරන ලද භාණ්ඩ, අන්තරායකර ඖෂධ, පස්, වැලි, නීතිවිරෝධී මත්පැන්, පුරාවස්තු, වන සත්ව සහ වෘක්ෂලතා ආඥා පනතෙහි සඳහන් වරදවල විෂය වස්තූන් යනාදිය.]

2.1 නිරීක්ෂණ:- 25

1. අනු කාණ්ඩ

2.2 කමිටුවේ නිර්දේශ:- 25-28

1. භාණ්ඩයේ ස්වභාවය අනුව සමාජයට සහ/හෝ පරිසරයට හානි කර වන්නා වූ ද්‍රව්‍ය
2. සමාජයට සහ/හෝ පරිසරයට හානියක් නොමැති, වටිනාකමක් සහිත ද්‍රව්‍ය
3. කඩිනමින් නරක් වන හෝ විනාශ වන ආකාරයේ ද්‍රව්‍ය (Perishable Goods)
4. කිසියම් පිළිවෙතකට අනුව ආරක්ෂා කර ගත යුතු දේ
5. සුවිශේෂී ආරක්ෂක ප්‍රතිපාදන අනුගමනය කරමින් සුරක්ෂිතව තබා ගත යුතු ඉහත අනු කාණ්ඩ 4න් එකකට වැටෙන්නා වූ ද්‍රව්‍ය

3. භාණ්ඩ කාණ්ඩ අංක 3 29

1 වන සහ 2 වන කාණ්ඩවලට නොවැටෙන, එනමුත් සාක්ෂිමය වටිනාකමක් තිබේ යයි විමර්ශන නිලධාරීන් විශ්වාස කරනු ලබන ද්‍රව්‍ය (Other items that may have evidential value.) [උදා:- වින්දිත පාර්ශවය සහ අපරාධකරු ඇඳ සිටි ඇඳුම් සහ අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද පරිවේශණීය ස්වරූපයක් ගන්නා විවිධ භාණ්ඩ යනාදිය.]

3.1 නිරීක්ෂණ:- 29

3.2 කමිටුවේ නිර්දේශ:-

1. ඉසව්ගත භාණ්ඩ සමඟ අනුරූප සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන අධිකරණයට ඉදිරිපත් කිරීම 29
2. ව්‍යවහාරික විමර්ශන විශේෂඥයින් වෙත නඩු භාණ්ඩ යොමු කිරීම සහ අධිකරණයට ඉදිරිපත් කිරීම.
3. නඩු භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝග ලබා ගැනීමේ ක්‍රමවේදය

4. භාණ්ඩ කාණ්ඩ අංක 4 30

අපරාධ සිදු කිරීමෙන් සෘජු ලෙස සහ ද්විතියිකව උපයාගනු ලබන දෑ (Proceeds of Crime) [උදා. සොර බඩු, සොර බඩු විකිණීමෙන් මිල දී ගනු ලබන දේපළ, මත්ද්‍රව්‍ය ජාවාරම්, අල්ලස් ලබා ගැනීම, මුදල් විශුද්ධිකරණය වැනි වරදවල් සිදු කිරීමෙන් ලබා ගන්නා ලද මුදල්වලින් මිල දී ගනු ලබන සහ/හෝ ආයෝජනය කිරීමෙන් ලබන චංචල සහ/හෝ නිශ්චල දේපළ සහ එමඟින් උපයනු ලබන ආදායම යනාදිය.]

5. භාණ්ඩ කාණ්ඩ අංක 5 31

වෝහාරික විමර්ශන අවස්ථාවේ දී වෝහාරික විශේෂඥයින් විසින් ස්වකීය සන්තකයට ගනු ලබන විවිධ නියැදි සහ ආදර්ශ (Samples and specimens collected by forensic scientists in the course of conducting forensic investigations), වෝහාරික විශේෂඥයින් විසින් නැවත මහේස්ත්‍රාත් අධිකරණයට හෝ අනුරූප නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ට භාර නොදී සිය සන්තකයේ රඳවා තබා ගනු ලබන භාණ්ඩ සහ සලකුණු .

5.1 නිරීක්ෂණ :- 31-32

1. නියැදි, ආදර්ශ, සලකුණු සහ සමස්ත නඩු භාණ්ඩයම විශේෂඥවරයා විසින් ලබා ගන්නා අවස්ථා
2. නියැදි, ආදර්ශ, සලකුණු සහ සමස්ත නඩු භාණ්ඩයම බැහැර නොකොට රඳවා තබා ගන්නා අවස්ථා

5.2 කමිටුවේ නිර්දේශ:- 32-34

1. නියැදි, ආදර්ශ, සලකුණු හෝ සමස්ත නඩු භාණ්ඩයම රඳවා තබා ගැනීමේ නියෝග ලබාගැනීමේ ක්‍රමවේදය
2. මෘත දේහයකින් කිසියම් නියැදියක් හෝ ආදර්ශයක් හෝ ශරීර අංගයක් වෝහාරික විශේෂඥයකු විසින් කවර හෝ පරමාර්ථයක් සඳහා රඳවා තබා ගනු ලැබීම
3. අපරාධ යුක්තිය පසිඳලීමේ පරමාර්ථයක් නොවන පරමාර්ථයක් සඳහා ආදර්ශය හෝ නියැදිය ලබා ගැනීම
4. වෝහාරික විමර්ශනයේ දි ලබාගනු ලබන ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන පිළිබඳ විස්තරාත්මක සටහන්
5. වෝහාරික විශේෂඥවරයකු විසින් ලබා ගන්නා ලද නඩු භාණ්ඩයක් නියැදියක් හෝ ආදර්ශයක් බැහැර කිරීමට අවශ්‍ය වන විට නියෝග ලබාගැනීමේ ක්‍රමවේදය
6. 1988 අංක 69 දරන ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ බලය
7. වෝහාරික විශේෂඥවරයකු සන්තකයේ තිබෙන නඩු භාණ්ඩයන්හි ආරක්ෂාව තහවුරු කිරීම

6. භාණ්ඩ කාණ්ඩ අංක 6 35

වෝහාරික ඩී.එන්.ඒ. (DNA) පරීක්ෂණ පැවැත්වීම පිණිස වෝහාරික විශේෂඥයින් වෙතට යොමු කරනු ලබන සහ එම විශේෂඥවරු විසින් ම හෝ ඔවුන් වෙනුවෙන් ලබා ගන්නා, (i) ජෛව සාම්පල (biological samples), (ii) ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය , (iii) ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස එකතු කර ගනු ලබන සත්ත්ව සහ ශාක කොටස්, සහ (iv) ඩී.එන්.ඒ. රටාවන් (DNA profiles).

6.1 නිරීක්ෂණ:- 35-36

1. ප්‍රතිපාදයන්හි අදාලත්වය
2. සුවිශේෂී නීතියක අවශ්‍යතාවය

6.2 කමිටුවේ නිර්දේශ:- 36-37

1. ජෛව සාම්පල, ඒ ආශ්‍රයෙන් පිළියෙල කරනු ලබන ඩී.එන්.ඒ. රටාවන් සහ ආනුෂංගික දත්ත සහ තොරතුරුවල සුපිළිපන් බව, පෞද්ගලිකත්වයත්, ආරක්ෂාව
2. ඩී.එන්.ඒ. රටාවන්හි සුපිළිපන් බව ආරක්ෂා කිරීම
3. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ අදාලත්වය
4. ජෛව සාම්පල, ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය සහ ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලබන සත්ත්ව සහ ශාඛ කොටස් බැහැර කිරීම
5. වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණ පැවැත්වීම සඳහා වැය වන මුදල අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළින්ම ඉපයීම

7. භාණ්ඩ කාණ්ඩ අංක 7 38

ඉහත කිසිදු කාණ්ඩයකට අයත් නොවන, අපරාධ විමර්ශන අවස්ථාවේ දී එකතු කරගන්නා ලද හෝ සොයා ගනු ලබන හිමිකරුවකු නොමැති බව පෙනී යන්නා වූ කිසියම් මුදලක් හෝ චංචල හෝ නිශ්චල දේපළක් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක තාවකාලික භාරයට ගෙන අධිකරණයට භාර දීමෙන් හෝ වාර්තා කිරීමෙන් අනතුරුව, අධිකරණය විසින් නැවත එම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයටම භාර දෙනු ලබන ද්‍රව්‍ය (උදා:- සැකකරුගේ සන්තකයේ තිබී භාර ගනු ලබන පෞද්ගලික භාණ්ඩ සහ හිමිකරුවකු නොමැති බව පෙනී යන හෝ හිමිකාරිත්වය ප්‍රතික්ෂේප කරනු ලබන ද්‍රව්‍ය - Suspect's personal property and property in respect of which there is either no claimant or ownership is denied)

8. භාණ්ඩ කාණ්ඩ අංක 8 39

විවිධ ස්ථානවල තිබී සොයා ගන්නා ලද, පොලිස් නිලධාරීන් ඇතුළු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය භාරයට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන, අයිතිකරුවකු සොයා ගැනීමට නොහැකි බවට පෙනී යන භාණ්ඩ (උදා. අයිතිකරුවෙකු නොමැතිව හෝ සැකකරුවෙකු නොමැතිව සොයා ගනු ලබන දේපළ, දැව හා රත්‍රං භාණ්ඩ සහ වෙනත් වටිනා දේපළ)

යෝජිත නීතියට අදාළ විශේෂ කරුණු සහ වෙනත් නිර්දේශ 40

## නඩු භාණ්ඩ හැඳින්වීම සහ වර්ගීකරණය

පොදුවේ නඩු භාණ්ඩ (productions) ලෙසට සලකනු ලබන විවිධ ද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අනතුරුව, ඒවා හි වැදගත්කම අනුව, අධ්‍යයන කටයුතු සඳහාත්, නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ප්‍රායෝගික ක්‍රමවේද හඳුන්වා දීම සඳහාත් අපරාධ සහ අපරාධ විමර්ශනවලට අදාළ ව එකතු කරගනු ලබන සහ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ පහත සඳහන් පරිදි ද්‍රව්‍ය කාණ්ඩ අටකට (08) කමිටුව විසින් වර්ගීකරණය කරන ලදී.

1. අපරාධ සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය (**Items used to commit crimes**) [උදා: අවි ආයුධ, මෙවලම්, යන්ත්‍රෝපකරණ, පරිගණක ඇතුළු විවිධ උපකරණ සහ මෝටර් රථ ඇතුළු සියලු ම වර්ගවල වාහන]

2. යම්කිසි අපරාධයක් සිදු කරන ලද්දේ යම් ද්‍රව්‍යයක් විෂයෙහි නම්, එවැනි ද්‍රව්‍ය (Items in respect of which crimes have been committed.) [උදා: මුදල්, දැව, මැණික්, සොරකම් කරන ලද භාණ්ඩ, අන්තරායකර ඖෂධ, පස්, වැලි, නීතිවිරෝධී මත්පැන්, පුරාවස්තු, වන සත්ව සහ වෘක්ෂලතා ආඥා පනතෙහි සඳහන් වරදවල විෂය වස්තූන් යනාදිය.]

3. ඉහත 1 වන සහ 2 වන කාණ්ඩවලට නොවැටෙන, එනමුත් සාක්ෂිමය වටිනාකමක් තිබේ යයි විමර්ශන නිලධාරීන් විශ්වාස කරනු ලබන ද්‍රව්‍ය (Other items that may have evidential value.) [උදා:- වින්දිත පාර්ශ්වය සහ අපරාධකරු ඇඳ සිටි ඇඳුම් සහ අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද පරිවේශණීය ස්වරූපයක් ගන්නා විවිධ භාණ්ඩ යනාදිය.]

4. අපරාධ සිදු කිරීමෙන් ඍජු ලෙස සහ ද්විතියිකව උපයාගනු ලබන දෑ (Proceeds of Crime.) [උදා. සොර බඩු, සොර බඩු විකිණීමෙන් මිල දී ගනු ලබන දේපළ, මත්ද්‍රව්‍ය ජාවාරම්, අල්ලස් ලබා ගැනීම, මුදල් විශුද්ධිකරණය වැනි වරදවල් සිදු කිරීමෙන් ලබා ගන්නා ලද මුදල්වලින් මිල දී ගනු ලබන සහ/හෝ ආයෝජනය කිරීමෙන් ලබන චංචල සහ/හෝ නිශ්චල දේපළ සහ එමඟින් උපයනු ලබන ආදායම යනාදිය.]

5. වෝහාරික විමර්ශන අවස්ථාවේ දී වෝහාරික විශේෂඥයින් විසින් ස්වකීය සන්තකයට ගනු ලබන විවිධ නියැදි සහ ආදර්ශ (Samples and specimens collected by forensic scientists in the course of conducting forensic investigations.)

6. වෝහාරික ඩී.එන්.ඒ. (DNA) පරීක්ෂණ පැවැත්වීම පිණිස වෝහාරික විශේෂඥයින් වෙතට යොමු කරනු ලබන සහ එම විශේෂඥවරු විසින් ම හෝ ඔවුන් වෙනුවෙන් ලබා ගන්නා, (i) ජෛව සාම්පල (biological samples), (ii) ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය, (iii) ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස එකතු කර ගනු ලබන සත්ත්ව සහ ශාක කොටස් සහ (iv) ඩී.එන්.ඒ. රටාවන් (DNA profiles).

7. ඉහත කිසිදු කාණ්ඩයකට අයත් නොවන, අපරාධ විමර්ශන අවස්ථාවේ දී එකතු කර ගන්නා ලද, අධිකරණයට භාර නොදුන්, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සන්තකයේ පවතින සහ අධිකරණයට භාර දීමෙන් අනතුරුව අධිකරණය විසින් නැවත එම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයටම හෝ වෙනත් ආයතනවලට භාර දුන් ද්‍රව්‍ය (උදා:- සැකකරුගේ සන්තකයේ තිබී භාර ගනු ලබන පෞද්ගලික භාණ්ඩ - Suspect's personal property)

8. විවිධ ස්ථානවල තිබී සොයා ගන්නා ලද, පොලිස් නිලධාරීන් ඇතුළු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය භාරයට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන, අයිතිකරුවකු සොයා ගැනීමට නොහැකි බවට පෙනී යන භාණ්ඩ (උදා:- අයිතිකරුවෙකු නොමැතිව හෝ සැකකරුවෙකු නොමැතිව සොයා ගනු ලබන දේපළ, දැව හා රත්තරං භාණ්ඩ සහ වෙනත් වටිනා දේපළ)

මෙම භාණ්ඩවලින් නඩු විභාගයකට අනුකූල (relevant) වන්නා වූ භාණ්ඩ, සාක්ෂි ආඥා පනතේ 60 වන වගන්තියෙහි දෙවන අතුරු විධානය ප්‍රකාරව භෞතික සාක්ෂියක් (real evidence) ලෙසට ආවේශ්‍ය කර ගත හැකිය. (උදාහරණ ලෙසට 1, 2, 3, 4, 5 සහ 6 වන කාණ්ඩවල භාණ්ඩ) බොහෝ විට මෙම භාණ්ඩ සාක්ෂියක් ලෙස අධිකරණයට ඉදිරිපත් කරන්නේ පැමිණිල්ල විසිනි. ඉතා ම සීමිත අවස්ථාවන්හි දී මෙම භාණ්ඩ විත්තිය විසින් ද සාක්ෂියක් ලෙසට ඉදිරිපත් කරනු ලබන අවස්ථා ඇත. ඇතැම් අවස්ථාවල දී දෙපාර්ශවය විසින් ම ඉදිරිපත් කරනු නොලබන, එහෙත් යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය විය හැකි යයි පෙනී යන භාණ්ඩ, අධිකරණය සිය අභිමතය ප්‍රකාරව සාක්ෂි ආඥා පනතේ 165 වන වගන්තිය යටතේ කැඳවා පරීක්ෂා කොට සාක්ෂියක් ලෙසට ලබා ගන්නා අවස්ථා ද පවතී.

නඩු භාණ්ඩ සම්බන්ධයෙන් දැනට ප්‍රතිපාදන අන්තර්ගත වන්නේ, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXVIII වන පරිච්ඡේදයේ ය. එහි 425(1) වන වගන්තියට අනුව, ඉහත පළමු වන සහ දෙ වන කාණ්ඩවල භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් කිරීමට අධිකරණයට බලය ලැබෙන්නේ අනුරූප නඩු විභාගය අවසාන වීමෙන් පසුව ය. විත්තිකරු වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කොට ඇති විට, භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් සිදු කළ හැක්කේ අභියාචනය ද අවසාන වීමෙන් අනතුරුව ය. නමුදු, ස්වාභාවිකව සහ කඩිනමින් නරක් වන ද්‍රව්‍ය සහ සතුන්, අනුරූප නඩුව අවසාන වීමට ප්‍රථමයෙන් වුව ද බැහැර කිරීමට නියෝගයක් කරනු ලැබිය හැකිය.

"නඩු භාණ්ඩ" ලෙසට පොදුවේ හඳුන්වනු ලැබුව ද කාණ්ඩ අංක 1 සහ 2 ට අයත් භාණ්ඩ බොහෝමයක සාක්ෂිමය වටිනාකමක් ඇති හෙයින්, එකී භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදය වෙනස් කිරීමේ දී, එය ඉතා ප්‍රවේශමෙන්, අපරාධ යුක්තිය පසිඳලීමේ පරමාර්ථවලට හානියක් නොවන පරිද්දෙන් කළ යුතු බැවින්, ඉහත කරුණු සලකා බලන ලද කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ පිළියෙල කරන ලදී.

# 1. භාණ්ඩ කාණ්ඩ අංක 1 - අපරාධ සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය (Items used to commit crimes) [උදා: අවි ආයුධ, මෙවලම්, යන්ත්‍රෝපකරණ, පරිගණක ඇතුළු විවිධ උපකරණ සහ මෝටර් රථ ඇතුළු සියලුම වර්ගවල වාහන]

## 1.1 නිරීක්ෂණ :-

| | |
|---|---|
| කවුරුන් විසින් මෙම භාණ්ඩ සන්තකයට ගනු ලබන්නේ ද යන වග | 1. මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ විමර්ශනය අවස්ථාවේ දී එකතු කර ගෙන සිය සන්තකයට බහුල වශයෙන් ගනු ලබන්නේ, පොලිස් නිලධාරීන්, වන නිලධාරීන් සහ සුරාබදු නිලධාරීන් වැනි නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසිනි. පොලීසිය විසින් පවත්වනු ලබන විමර්ශනවල දී, බොහෝ විට අපරාධ ස්ථානවල තිබෙන මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ එම ස්ථානයේ තිබිය දී ම නිරීක්ෂණය කොට ස්වකීය භාරයට ගනු ලබන්නේ, විශේෂිත පොලිස් නිලධාරීන් කණ්ඩායමක් වන "අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන්" (Scene of Crime Officers - SOCO) විසිනි. ඊට අමතර ව, අපරාධ විමර්ශන නිලධාරීන් (Investigation Officers) විසින් ද මෙම භාණ්ඩ ස්වකීය භාරයට ගනු ලබයි. |
| මරණ පරීක්ෂණ පවත්වන මහේස්ත්‍රාත්වරුන්ගේ නියෝග ප්‍රකාරව සන්තකයට ගනු ලබන ද්‍රව්‍ය | 2. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXX වන පරිච්ඡේදය ප්‍රකාරව මරණ පරීක්ෂණ (Inquests) පවත්වනු ලබන අවස්ථාවන්හි දී, එය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයා විසින් ස්ථානීය පරීක්ෂණය පවත්වන අතරතුර ඇතැම් අවස්ථාවල දී යම් යම් භාණ්ඩ පොලීසිය භාරයට ගනු ලබන ලෙසට නියෝග කරනු ලබයි. එවැනි අවස්ථාවන්හි දී, අදාළ පොලිස් නිලධාරීන් එකී නියෝග ප්‍රකාරව, එම භාණ්ඩ සිය සන්තකයට ගනු ලබයි. |
| විශේෂඥයින්ගේ උපදෙස් ප්‍රකාරව සන්තකයට ගනු ලබන ද්‍රව්‍ය | 3. අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමට පැමිණෙන විශේෂඥයින් විසින් පොලිස් නිලධාරීන් හට ඇතැම් විට දෙනු ලබන උපදෙස් ප්‍රකාරව ද, පොලිස් නිලධාරීන් විසින් යම් යම් භාණ්ඩ ස්වකීය භාරයට ගනු ලබන අවස්ථා ඇත. |
| භාණ්ඩ සන්තකයට ගනු ලැබීමෙන් අනතුරුව ඒවාට සිදු වන දේ | 4. මෙම භාණ්ඩවලින් සමහරක් ඉහත සඳහන් නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය භාරයේ තබාගෙන, මහේස්ත්‍රාත් අධිකරණවලට ඉදිරිපත් කරනු ලබයි. තවත් සමහර භාණ්ඩ, එම නිලධාරීන්ගේ භාරයට ගෙන, සෘජු ලෙසම ව්‍යවහාරික විමර්ශන සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට හෝ වෙනත් විශේෂඥයින් වෙතට ඉදිරිපත් කරනු ලබයි. එම භාණ්ඩ විෂයයෙහි ව්‍යවහාරික විමර්ශන සිදු කිරීම අවශ්‍ය නොවේ යයි තීරණය කර තිබෙන අවස්ථාවන්හි දී, ඇතැම් භාණ්ඩ නඩු විභාගය ආරම්භ වනතෙක් ම අනුරූප විමර්ශන ආයතන භාරයේ ම තබා ගනු ලබන අවස්ථා ද ඇත. මෙසේ සන්තකයට ගනු ලබන ඇතැම් භාණ්ඩ කවර විටෙකවත් නඩු විභාගයක දී ඉදිරිපත් නොකෙරෙන අවස්ථා ද ඇත. එනමුත්, ඒවා කඩිනමින් බැහැර නොකෙරෙන අවස්ථා ද ඇත. |
| ව්‍යවහාරික විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව මෙම භාණ්ඩවලට සිදුවන දේ | 5. (1) ව්‍යවහාරික විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව, අදාළ ව්‍යවහාරික විශේෂඥ ආයතනය සන්තකයේ තිබූ ව්‍යවහාරික විමර්ශනයට ලක් කරන ලද භාණ්ඩ නැවත මහේස්ත්‍රාත් අධිකරණය හෝ නඩු විභාගය අවස්ථාවේ දී මහාධිකරණය වෙතට ඉදිරිපත් කරනු ලැබේ. ව්‍යවහාරික විශේෂඥ ආයතනය (උදා:- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව) සන්තකයේ තිබෙන ඇතැම් භාණ්ඩ ඉවත් කර ගන්නා ලෙසට නිවේදන යැවීමෙන් අනතුරුව පවා එම භාණ්ඩ එම ආයතනයෙන් ඉවත් කරගනු නොලබන අවස්ථා ද ඇත. ඇතැම් අවස්ථාවන්හි දී ව්‍යවහාරික විමර්ශනය නිම කරන ලද භාණ්ඩ අධිකරණය විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා ද ඇති බව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් වාර්තා වී ඇත. මෙයට හේතුව, එකී භාණ්ඩ ආරක්ෂිතව තබා ගැනීමට ඇතැම් |

අධිකරණයන්හි ඉඩ පහසුකම් නොමැති වීම බව ද වාර්තා වුණි. මේ හේතුව නිසා, මේ වන විට, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව භාරයේ භාණ්ඩ විශාල ප්‍රමාණයක් ගොඩගැසී ඇති අතර, එම නිසා එම දෙපාර්තමේන්තුවට විශාල අපහසුතාවයකට මුහුණ දීමට සිදු වී ඇත.

(2) කිසියම් නඩු භාණ්ඩයකට අනුරූප නඩු විභාගය අවසාන වීමෙන් අනතුරුව, ඒ වන විටත්, එකී භාණ්ඩ වෝහාරික විශේෂඥ ආයතනයක් සන්තකයේ තිබේ ද යන්න පරීක්ෂා කර බලා, එසේ තිබේ නම්, එය විනාශ කිරීමට අධිකාරිය ලබා දෙන නියෝගයක් අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි සිදු නොකිරීම, මෙම තත්ත්වය උත්සන්න වීමට ප්‍රධාන හේතුවක් වී ඇත. තව ද, 1988 අංක 69 දරණ ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනතෙහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් අනවශ්‍ය නඩු භාණ්ඩ විනාශ කිරීම ප්‍රායෝගිකව සිදු නොවන බව ද පෙනී යයි.

(3) වෝහාරික විමර්ශන පැවැත්වීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණයට නැවත එවනු ලබන භාණ්ඩ සහ වෝහාරික විමර්ශන පැවැත්වීම අනවශ්‍ය වන භාණ්ඩ, අනුරූප නඩු විභාගය මහේස්ත්‍රාත් අධිකරණයෙහි හෝ මහාධිකරණයෙහි පවත්වා අවසාන වනතෙක්, මහේස්ත්‍රාත් අධිකරණය භාරයෙහි පවතී. එනමුත්, මහාධිකරණය විසින් නඩු භාණ්ඩ කැඳවනු ලබන විට, එම භාණ්ඩ මහාධිකරණය වෙත මහේස්ත්‍රාත් අධිකරණය විසින් යොමු කරනු ලබයි. එතැන් සිට මෙම භාණ්ඩ මහාධිකරණය භාරයේ පවතී.

**භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධ නියෝග පිළිබඳ වත්මන් තත්ත්වය**

6. (1) සාමාන්‍යයෙන්, ආහාර ද්‍රව්‍ය වැනි ඉක්මනින් නරක් වන ආකාරයේ ද්‍රව්‍ය හැරුණු විට, මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ බැහැර කිරීම පිළිබඳ ව නියෝගයක් අධිකරණය විසින් දෙනු ලබන්නේ සම්පූර්ණ නඩු විභාගය අවසානයේ දී ය.

(2) අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 425(1) වන වගන්තියට අනුව, මහාධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අනුරූප නඩු විභාගය අවසාන වූ විට, මෙම කාණ්ඩයේ භාණ්ඩ සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ම භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් කළ යුතු බවට ද නීතියෙහි සඳහන් වන්නේ නැත. එසේ හෙයින්, මෙම කාණ්ඩයේ භාණ්ඩ අනුරූප නඩු විභාගය අවසාන වීමෙන් පසුව ද, අධිකරණය භාරයේ පවතින අවස්ථා බහුලව නිරීක්ෂණය වී ඇත.

(3) ඇතැම් අවස්ථාවන්හි දී, අනුරූප අභියාචනය අවසන් වනතෙක් ද, ඉන් පසුව පවා ද, මෙම භාණ්ඩ අධිකරණයන් භාරයේ පවතී.

(4) නඩු භාණ්ඩ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී සිදු කරන ලද අධ්‍යයනයක දී, අධිකරණ පරිශ්‍රයන්හි ගන්නා ලද ඡායාරූප විශාල සංඛ්‍යාවක් මෙම කමිටුව විසින් අධ්‍යයනය කරන ලදී. මෙම ඡායාරූප අධ්‍යයනය කිරීමේ දී කමිටුවට පෙනී ගියේ රථ වාහන ඇතුළු වෙනත් වටිනා භාණ්ඩ අති විශාල ප්‍රමාණයක් පරිහානියට පත්වෙමින් විනාශ වන බව ය. තව ද, වාහන සැලකිය යුතු ප්‍රමාණයක් පොලිස් ස්ථාන පරිශ්‍රයන්හි ද රඳවා තබා ඇති බව කමිටු සාමාජිකයන් විසින් නිරීක්ෂණය කොට ඇත.

## 1.2 කමිටුවේ නිර්දේශ:-

**මුඛ්‍ය පරමාර්ථය**

මෙහි පහත සඳහන් කර තිබෙන නව ක්‍රමවේද යෝජනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ, ලද ප්‍රථම අවස්ථාවේ දී ම මෙම කාණ්ඩයේ භාණ්ඩ අතුරින් යෝජිත නඩු විභාගයේ දී භෞතික සාක්ෂියක් ලෙසට ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වන්නා වූ නඩු භාණ්ඩ හැර, අන් සියලුම නඩු භාණ්ඩ කඩිනමින් අධිකරණයේ භාරයෙන් අවස්ථාවෝචිත පරිදි බැහැර කරවීමට හෝ විනාශ කරවීමට සැලැස්වීම ය. එසේ බැහැර කරනු ලබන භාණ්ඩ අධිකරණය හමුවට භෞතික සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීමට වෛකල්පිතව, එම භාණ්ඩ සම්බන්ධයෙන් වූ ලිඛිත වාර්තාවක්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින සාක්ෂි ලෙසට ඉදිරිපත් කිරීමට සැලැස්වීම ය.

**නව නීතියක අවශ්‍යතාවය**

1. මෙහි සඳහන් යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස විෂයය මූලික නව පනතක් පාර්ලිමේන්තුව මඟින් පැනවිය යුතුය.

   එකී යෝජිත නීතිය මඟින්, එහි සඳහන් ප්‍රතිපාදනවලට පටහැනි වන්නා වූ කිසියම් ප්‍රතිපාදනයක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ඇතුළු වෙන යම් කිනම් හෝ නීතියක තිබේ නම්, මෙම නීතියෙහි අනුරූප ප්‍රතිපාදනය බලාත්මක විය යුතු බවට සඳහන් විය යුතු ය.

**මූලික සිද්ධාන්තය සහ ව්‍යාතිරේකී අවස්ථා**

2. මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ නඩු විභාගය අවසාන වනතෙක් අධිකරණය භාරයේ තබා නොගෙන, හැකි ඉක්මනින් කොන්දේසි සහිතව හෝ රහිතව බැහැර කිරීම (disposal) යෝජිත නව නීතියෙහි මූලික සිද්ධාන්තය (fundamental principle) විය යුතු අතර, ඒවා නඩු විභාගය අවසන් වනතෙක් අධිකරණය භාරයේ තබා ගැනීම ව්‍යාතිරේකී අවස්ථාව (exceptional situation) විය යුතුය.

   මෙම කාණ්ඩයේ භාණ්ඩ අධිකරණය භාරයේ නඩුව අවසාන වනතෙක් තබා ගැනීම (එනම්, ව්‍යාතිරේකී අවස්ථාව) සිදු විය යුත්තේ, එකී භාණ්ඩ, භෞතික සාක්ෂියක් (real evidence) ආකාරයටම අධිකරණය විසින් නඩු විභාගයේ දී ඍජු ලෙස නිරීක්ෂණය කිරීමේ සුවිශේෂී අවශ්‍යතාවයක් (exceptional necessity) පවතින විට පමණි.

**නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් කුමන භාණ්ඩ ස්වකීය සන්තකයට ගත යුතු ද යන වග**

3. මෙම කාණ්ඩයේ භාණ්ඩ අතුරින් අපරාධ විමර්ශනය අවස්ථාවේ දී කවර භාණ්ඩ පොලීසියෙහි හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක භාරයට ගත යුත්තේ ද නැද්ද පිළිබඳ අභිමතය සහ අනුරූප වගකීම, තවදුරටත්, එකී නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය සතුව ම තිබිය යුතු ය. මෙම අභිමතය සහ වගකීම සද්භාවයෙන්, අපරාධ විමර්ශන සහ අපරාධ යුක්තිය පසිඳලීමේ අවශ්‍යතාවයන්ට ගැලපෙන ප්‍රමාණයන් සඳහා පමණක්, අවස්ථාවෝචිත පරිදි භාවිතා කළ යුතු ය. තව ද, එකී අභිමතය භාවිතා කළ යුතු ආකාරය නියාමනය කෙරෙන නිර්ණායක අදාළ ආයතන විසින් අභ්‍යන්තර රීතීන් ලෙසට ප්‍රකාශයට පත් කොට, ඒ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම කළ යුතුය.[1] මෙහි පරමාර්ථය වන්නේ, අපරාධ විමර්ශනාත්මක සහ යුක්තිය පසිඳලීමේ පරමාර්ථ සඳහා අත්‍යාවශ්‍ය වන්නා වූ භාණ්ඩ පමණක්, නිලධාරීන් විසින් ස්වකීය සන්තකයට ගැනීමට සැලැස්වීම ය. යම්කිසි භාණ්ඩයක් ස්වකීය සන්තකයට ගත යුතු ද, නැද්ද

---

[1] මෙම නිර්ණායක කෙටුම්පත් කිරීමේ දී ජාත්‍යන්තරව පිළිගනු ලබන ප්‍රමිතීන් සහ දෙස් - විදෙස් විශේෂඥයින්ගේ මත සැලකිල්ලට ගත යුතු ය. එම නිර්ණායක කෙටුම්පත් කිරීමෙන් අනතුරුව, ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීම සුදුසු ය. ඊට අමතරව, ඒවා පිළිබඳ ව, අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයට සම්බන්ධ වෙනත් වෘත්තිකයින්ගේ මත ද විමසා, එකී මතයන්ට ද අවධානයට යොමු කොට, එකී නිර්ණායක සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීම වඩාත් යෝග්‍ය වේ.

සම්බන්ධයෙන් සැකයක් පවතින විට, ඒ පිළිබඳ ව අපරාධ විමර්ශන විශේෂඥයින් සහ ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීම යෝග්‍ය වේ.

**සන්තකයට ගනු ලබන සහ ගනු නොලබන භාණ්ඩවල සවිස්තරාත්මක වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින පිළියෙල කිරීම**

4. මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ (ස්වකීය සන්තකයට නිලධාරීන් විසින් ගනු ලබන සහ සාක්ෂිමය වටිනාකමක් තිබිය හැකි, එනමුත් සන්තකයට ගනු නොලබන) සම්බන්ධයෙන් මෙහි පහත 6 වන ඡේදයෙහි සඳහන් ආකාරයට සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙල කළ යුතු අතර, ඒවාහි ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ද ලබා ගැනීම වඩාත් යෝග්‍ය වේ. මෙහි පරමාර්ථය වන්නේ, අදාළ භාණ්ඩය නඩු විභාගය ආරම්භ විමට ප්‍රථමයෙන් බැහැර කොට, සාක්ෂියක් ලෙසට අදාළ වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ඉදිරිපත් කිරීම ය. මෙම භාණ්ඩ අතුරින් කවර භාණ්ඩ, (1) ස්වකීය භාරයට ගෙන ඒවා හි ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ලබා ගත යුත්තේ ද, (2) ක්ෂේත්‍රයේ තිබිය දී ම ඒවා ඡායාරූප සහ/හෝ වීඩියෝගත කිරීමෙන් අනතුරුව ස්වකීය භාරයට ගත යුත්තේ ද, එසේත් නැතහොත්, (3) ක්ෂේත්‍රයේ තිබිය දී ම ඒ පිළිබඳ ව සටහන් යොදා ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ලබා ගැනීම ප්‍රමාණවත් වන්නේ ද යන්න, අදාළ නීතිය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් නිවැරදි නිර්ණායක[2] භාවිතා කරමින් තීරණය කළ යුතු ය.

**සවිස්තරාත්මක වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින පිළියෙල කිරීමේ කාර්යය පටිපාටිය**

5. මෙම කාණ්ඩයේ භාණ්ඩ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාව පිළියෙල කිරීම, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කළ යුතු ය.

(1) ස්වකීය භාරයට ගනු ලබන භාණ්ඩ සහ ක්ෂේත්‍රයේ තිබෙන සාක්ෂිමය වටිනාකමක් ඇති භාරයට ගනු නොලබන භාණ්ඩ පිළිබඳ ව පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක්[3] (descriptive report) ඒ සඳහා විශේෂිත පුහුණුවක් ලද නිලධාරියෙකු විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. තව ද, අවස්ථානුරූපී ව, ඒ සඳහා නිසි සම්පත් ලබා ගැනීමට කිසිසේත් නොහැක්කේ නම් මිස හෝ අවස්ථානුකූල තත්ත්වයන් යටතේ සිදු කිරීමට නොහැක්කේ නම් මිස, එම භාණ්ඩයන් හි ඡායාරූප (Photographs) සහ/හෝ වීඩියෝ රෙකෝඩින ද (Video Recordings) ලබා ගත යුතු ය.[4] ඉහත සඳහන් පරිදි අදාළ නඩු භාණ්ඩයෙහි ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින අවස්ථානුකූල තත්ත්වයන් යටතේ හෝ නිසි සම්පත් නොමැති වීම හේතුවෙන් ලබා ගැනීමට කිසිසේත් නොහැකි වුණු අවස්ථාවක දී ඒ බවට තත්කාලීන සටහනක් යොදා, ඉන් අනතුරුව, අධිකරණයට කරුණු වාර්තා කරනු ලබන ප්‍රථම අවස්ථාවේ දී මහේස්ත්‍රාත්වරයාට වාර්තා කරනු ලැබිය යුතුය.

පොලිස් නිලධාරීන් විසින් පවත්වනු ලබන විමර්ශනයන් හි දී, මෙම කර්තව්‍යය අදාළ විමර්ශන නිලධාරියාගේ උපදෙස් ප්‍රකාරව, අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන් (SOCO) විසින් සිදු කරනු ලැබීම වඩාත් උචිත ය.[5] නොඑසේ නම්, අදාළ පොලිස් ස්ථානාධිපතිවරයා හෝ අදාළ

---

[2] ඉහත අංක 1 දරණ පාද සටහනෙහි ඇති ක්‍රියාපටිපාටියම අනුගමනය කරමින් පිළියෙල කිරීම යෝග්‍ය වේ.

[3] මෙකී විස්තරාත්මක වාර්තාවට ඇතුළත් කළ යුතු කරුණු කවරේ ද යන්න පිළිබඳ ව නිර්ණායක ඉහත අංක 1 පාද සටහනෙහි ම ඇති ක්‍රියාපටිපාටියම අනුගමනය කරමින් ම පිළියෙල කිරීම යෝග්‍ය වේ. මෙම වාර්තාවෙහි දෘඩ පිටපත් (Hard Copies) පිළියෙල කිරීම අපහසු හෝ ප්‍රායෝගික නොවන අවස්ථාවන්හි දී, ඒවාහි මෘදු/ඉලෙක්ට්‍රොනික පිටපත් (Soft/Electronic Copies) පිළියෙල කිරීම ප්‍රමාණවත් වේ.

[4] මෙම ඡායාරූප සහ/හෝ වීඩියෝගත රෙකෝඩින පිළියෙල කිරීම පිළිබඳ නිර්ණායක පිළියෙල කිරීමේ දී ඉහත අංක 1 දරණ පාද සටහනෙහි සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීම යෝග්‍ය වේ.

[5] බොහෝ අපරාධ විමර්ශනවල දී විමර්ශන නිලධාරීන් විසින් සන්තකයට ගනු ලබන සහ වාර්තා ගත කරනු ලබන භෞතික ද්‍රව්‍යවල වෝහාරික වටිනාකමක් (forensic value) තිබෙන හෙයින්, ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම විශේෂ පුහුණුවක් ඇති

පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ඔහු ඉදිරියේ දී සිදු විය යුතු ය.

(2) ස්වකීය භාරයට ගනු ලබන භාණ්ඩ සහ ක්ෂේත්‍රයේ තිබෙන සාක්ෂිමය වටිනාකමක් ඇති භාරයට ගනු නොලබන භාණ්ඩ පිළිබඳ ඉහත සඳහන් පූර්ණ විස්තරාත්මක වාර්තාවෙහි, ඡායාරූපවල සහ/හෝ වීඩියෝ රෙකෝඩිනවල සහතික පිටපත් අවස්ථාවෝචිත පරිදි (අ) මහේස්ත්‍රාත් අධිකරණයට (නඩු වාර්තාවේ ගොනු කිරීම පිණිස), (ආ) පොලීසිය හෝ අවස්ථාවෝචිත පරිදි, විමර්ශනය පවත්වනු ලබන අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය හෝ ඒකකය පවත්වාගෙන යනු ලබන විමර්ශන ගොනුවට, (ඇ) ගරු නීතිපතිතුමාට යොමු කිරීම පිණිස, (ඈ) ව්‍යවහාරික විශේෂඥවරයාට යොමු කිරීම සඳහා, සහ (ඉ) නඩු පැවරීමක් සිදු වුවහොත්, එක් එක් විත්තිකරුට භාර දීම සඳහා එම අවශ්‍යතාව හට ගත් විගස පිළියෙල කරනු ලැබිය යුතු අතර, එහි වගකීම ස්ථානාධිපතිවරයා දැරිය යුතුය.

(3) කිසියම් භාණ්ඩයක් යම් ආකාරයකට ආවරණය කොට මුද්‍රා තැබීම අවශ්‍ය විට, එසේ කිරීමෙන් අනතුරුව හෝ වෙන යම් භාජනයක දමා මුද්‍රා තැබීමෙන් පසුව, ඒ පිළිබඳව විස්තර ඉහත සඳහන් වාර්තාවට ඇතුළත් කිරීම, ඒවායෙ හි ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින පිළියෙල කිරීම ද සිදු කළ යුතු ය.

**භාණ්ඩ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය භාරයේ සුරක්ෂිතව තබා ගැනීම**

6. මෙම භාණ්ඩ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ හෝ වෙන යම් නීතියක ප්‍රතිපාදන ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය හෝ නඩු විභාග අධිකරණය වෙතට ඉදිරිපත් කරනු ලබන තෙක් තවදුරටත් පොලීසිය හෝ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙහි සුරක්ෂිත භාරයේ (safe custody) තබා ගත යුත්තේ ය. එම භාණ්ඩ විෂයෙහි දැනට ගනු ලබන පියවර (උදා: නඩු භාණ්ඩ රෙජිස්ටරයෙහි සටහන් කිරීම සහ නඩු භාණ්ඩ භාරකරුට භාර දීම) තවදුරටත් එපරිද්දෙන් ම කරගෙන යා යුතු ය.

**ඉසව්ගත භාණ්ඩ සමඟ අනුරූප සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින අධිකරණයට ඉදිරිපත් කිරීම[6]**

7. මෙම භාණ්ඩ මහේස්ත්‍රාත් අධිකරණයට ප්‍රථම වතාවට ඉදිරිපත් කරනු ලබන විට, ඊට අදාළ ව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ දැනට සඳහන්ව පවතින අවශ්‍යතාවයන් [116(2) වන වගන්තිය] ඉෂ්ට කිරීමට වැඩිමනත් වශයෙන්, ඉහත සඳහන් කරන ලද ලිඛිත වාර්තාවෙහි මුලික පිටපත, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩිනවල පිටපතක් ද සමඟ අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.[7] ව්‍යවහාරික විමර්ශන සඳහා මෙම භාණ්ඩ විශේෂඥයකු වෙත යොමු කරන්නේ නම්, ඉහත සඳහන් ලිඛිත වාර්තාවෙහි සහතික පිටපතක්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩිනවල පිටපතක් ද, නඩු භාණ්ඩ සමඟ විශේෂඥවරයාට යැවීම පිණිස අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. මෙම වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩිනවල අන්තර්ගතය නිවැරදි ව තිබේ දැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව, අධිකරණයට භාර දුන් බවට සහ අධිකරණය විසින් ලබා ගත් බවට අදාළ නිලධාරීන් සටහන් තැබිය යුතු ය.

---

පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කිරීම යෝග්‍යය. මේ සඳහා පොලිස් අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන් කණ්ඩායමක් (SOCO) රාජකාරි කරනු ලබයි. වර්තමානයේ සිටින SOCO නිලධාරීන් සංඛ්‍යාවේ, ඔවුන් සතු උපකරණ සහ පහසුකම්වල සහ ඔවුන් ස්ථානගත කර ඇති ආකාරය ප්‍රමාණවත් නොවන බව කමිටුව අවබෝධ කරගෙන සිටී. එසේ හෙයින්, මේ පිළිබඳ සුදුසු පරිපාලනමය පියවර ගැනීමේ යෝග්‍යතාවය කමිටුව නිරීක්ෂණය කරයි.

[6] අධිකරණවල කටයුතු ඩිජිටල්කරණය කිරීමට අදාළ නව නීතියක් ඉදිරියේ දී හඳුන්වා දීමට අපේක්ෂිත යැයි පෙනී යන හෙයින්, මෙහි සඳහන් ක්‍රමවේදය ඊට අනුකූල විය යුතු යයි කමිටුවේ මතය යි.

[7] කිසියම් විශේෂිත නීතියක් ප්‍රකාරව, වරදක් විමර්ශනය කිරීමේ දී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයෙහි ප්‍රතිපාදන අනුගමනය කිරීම අනිවාර්ය නොවන කල්හි, මෙම යෝජිත ප්‍රතිපාදනය ප්‍රකාරව කටයුතු කිරීම අවශ්‍ය නොවේ. එනමුදු, මෙහි සඳහන් ලිඛිත වාර්තාවේ පිටපත අදාළ නඩු විභාග අධිකරණය හමුවේ නඩු පවරන අවස්ථාවේ දී පැමිණිල්ල නොපසේ නම්, අධි චෝදනා පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**වෝහාරික විමර්ශන විශේෂඥයින් වෙතට නඩු භාණ්ඩ සමඟ සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප, වීඩියෝ රෙකෝඩන ඉදිරිපත් කළ යුතු බව**

8. වෝහාරික විමර්ශන සඳහා විශේෂඥයින් වෙතට මෙම භාණ්ඩ ඉදිරිපත් කිරීම දැනට පවතින ක්‍රමවේදයටම අනුව සිදු කළ යුතුය. ඒ සමඟ, ඉහත සඳහන් සවිස්තරාත්මක වාර්තාවේ සහතික පිටපතක්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල පිටපතක් ද සමඟ අදාළ විශේෂඥවරයා වෙත යොමු කළ යුතු ය.

**නඩු භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝග නිකුත් කිරීමේ ක්‍රමවේදය**

9.

(1) කිසියම් භාණ්ඩයක් විෂයෙහි (අ) වෝහාරික විමර්ශන අවසාන වීමෙන් අනතුරුව, හෝ (ආ) වෝහාරික විමර්ශන සිදු කිරීම අවශ්‍ය නොවන බවට විමර්ශන නිලධාරීන් අධිකරණයට වාර්තා කර ඇති විට, එම භාණ්ඩය විෂයයෙහි පිළියෙල කොට තිබෙන සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන නිවැරදිව තිබේ දැයි පරික්ෂා කර බලා, එකී භාණ්ඩයේ ආවරණ (covers and containers) අධිකරණය භාරයේ ම තවදුරටත් තබා ගෙන, අදාළ භාණ්ඩ අවස්ථාවෝචිත පරිදි කොන්දේසි සහිතව හෝ රහිතව බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් මෙහි සඳහන් මූලධර්ම සහ අනෙකුත් ප්‍රතිපාදනවලට යටත් ව, එම අවස්ථාව වන විට එම භාණ්ඩ පවතින්නේ කිසියම් මහේස්ත්‍රාත් අධිකරණයක් භාරයේ ද, එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කළ යුතු ය.

(2) ඉහත 9(1) ඡේදය ප්‍රකාරව භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් මහේස්ත්‍රාත්වරයකු විසින් සිදු කළ යුත්තේ පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් අනතුරුවය.

(අ) අදාළ භාණ්ඩය එයාකාරයෙන්ම නඩු විභාගය වනතෙක් තබාගත යුත්තේ ද, නොඑසේව, අදාළ ආවරණ සහ බහාලුම් සුරක්ෂිතව තබා ගෙන ඉසව්ගත නඩු භාණ්ඩය බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් සිදු කිරීම පිළිබඳව (i) විමර්ශන නිලධාරියාගේ, (ii) ඒ වන විට පැමිණිල්ල වෙනුවෙන් නීතිඥ නියෝජනයක් තිබේ නම්, අදාළ නියෝජිත නීතිඥවරයාගේ, සහ (iii) එම අවස්ථාව වන විට නීති කෘත්‍යයට අනුරූප සැකකරුවකු වෙතොත්, එකී සැකකරු නියෝජනය කරන නීතිඥවරයාගේ හෝ සැකකරුගේ ස්ථාවරය විමසිය යුතුය. තව ද, ඉසව්ගත අපරාධයෙහි වින්දිත පාර්ශවය එම අවස්ථාව වන විට නීතිඥවරයකු මාර්ගයෙන් නියෝජනය වන්නේ නම්, එම නීතිඥවරයාගේ හෝ අධිකරණය හමුවෙහි එම අවස්ථාව වන විට අපරාධ වින්දිත පෙනී සිටී නම්, එම තැනැත්තාගේ ස්ථාවරය ද, විමසිය යුතුය.

(ආ) ඉහත සඳහන් පාර්ශවයන්ගේ ස්ථාවරය විමසීමෙන් අනතුරුව, අවශ්‍ය වේ යයි මහේස්ත්‍රාත්වරයා තීරණය කරනු ලබන විට හෝ ඉහත සඳහන් පාර්ශවයක් නඩු භාණ්ඩ නඩු විභාගය වන තෙක් බැහැර නොකරන ලෙසට සහ විනාශ නොකරන ලෙසට ඉල්ලා තිබෙන විට, ඒ වන විටත්, නීතිපති නියෝජනයක් අධිකණය හමුවේ නොපවතී නම්, ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය විමසමින් සන්දේශයක් මහේස්ත්‍රාත්වරයා විසින් නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය. එම සන්දේශයට ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පවත්වන ලද, විමසීමට අදාළ අධිකරණ සටහන් (proceedings) සහ මහේස්ත්‍රාත්වරයාගේ නිරීක්ෂණ ඇතුළත් කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදයන් හි සඳහන් විමසීමේ දී, ඉසව්ගත නඩු භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් කිරීමට ඉහත සඳහන් කිසිදු පාර්ශවයක් විරුද්ධ නොවුනහොත් සහ එවැනි නියෝගයක් කිරීම යුක්තිය පසිඳලීමේ පරමාර්ථවලට පටහැනි නොවන බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන කල්හි, අදාළ භාණ්ඩය මෙහි සඳහන් ප්‍රතිපාදනවලට යටත්ව බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් අදාළ මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(ඈ) නීතිපතිවරයාගේ මතය විමසීමෙන් මාස තුනක (03) කාලයක් ඇතුළත නීතිපතිවරයා විසින් ස්වකීය මතය ලිඛිතව හෝ වාචිකව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය. මාස තුනක (03) කාලසීමාව ඇතුළත ස්වකීය මතය නීතිපතිවරයා විසින් අධිකරණයට වාර්තා නොකළහොත්, ඉසව්ගත භාණ්ඩය විනාශ කිරීමේ හෝ බැහැර කිරීමේ නියෝගයක් අධිකරණය විසින් නිකුත් කිරීමට නීතිපතිවරයා විරුද්ධ නොවන බවට අනුමිතියකට එළඹීමට මහේස්ත්‍රාත්වරයාට හැකිය.

(ඉ) නීතිපතිවරයාගේ මතය ලිඛිතව හෝ නීතිපතිවරයාගේ නියෝජිතයෙකු විසින් වාචිකව ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට නීතිපතිවරයා අපේක්ෂා කරනු නොලබන බව දැන ගැනීමෙන් අනතුරුව, ඉහත මාස තුනක (03) කාලය ගත වීමට ප්‍රථමයෙන් වුව ද, එකී භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලැබිය හැකිය.

(ඊ) ඉහත (අ) සහ (ආ) ඡේදයන් හි සඳහන් පාර්ශවයන්ගේ ස්ථාවරයන්, නීතිපතිවරයාගේ මතයත්, යෝජිත නීතියෙහි මූලික පරමාර්ථත් සැලකිල්ලට ගෙන, මහේස්ත්‍රාත්වරයා විසින් ඉසව්ගත භාණ්ඩය බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් මෙහි පහත සඳහන් ප්‍රතිපාදනවලට යටත්ව කරනු ලැබිය යුතුය.

පැහැදිලි කිරීම

අදාළ භාණ්ඩයෙහි විස්තරාත්මක වාර්තාවක්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන නිවැරදිව තිබේදැයි පරීක්ෂා නොකොට, කවර විටෙකවත්, භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝගයක් සිදු නොකළ යුතුය.

භාණ්ඩ විනාශ කිරීම

(3) කිසිදු මූල්‍යමය වටිනාකමක් නොමැති හෝ බැහැර කිරීම මඟින් සමාජයට හානිකර විය හැකි සියලු භාණ්ඩ අප්‍රමාදව විනාශ කිරීමට අධිකරණයට බලයක් තිබිය යුතුය. එකී වගකීම අධිකරණ නියෝගය ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම එකී අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සතු විය යුතුය.[8]

භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(4) කිසියම් වටිනාකමක් තිබිය හැකි, මෙහි විශේෂ විධිවිධාන සලස්වා නොමැති නඩු භාණ්ඩ, ඒවා හි සන්තකය කිසිදු පාර්ශවයක් විසින් ඉල්ලුම් කර නැති විටෙක හෝ ඉල්ලුම් කර තිබුනත්, එකී පාර්ශවයට භාර දීම ප්‍රතික්ෂේප කිරීමට අධිකරණය තීරණය කර ඇති විටෙක, ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියෙහි විකිණීමට මහේස්ත්‍රාත් හෝ මහාධිකරණ විසින් නියෝග කළ යුතුය. එම නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම අදාළ අධිකරණයෙහි රෙජිස්ට්‍රාර්වරයා

[8] මේ සඳහා අවශ්‍ය රීතින් සෑදීමේ බලය යෝජිත පනතින් අධිකරණ සේවා කොමිෂන් සභාවට පැවරිය යුතු අතර, එම බලය ප්‍රකාරව එම රීතින් එකී කොමිෂන් සභාව විසින් පැනවිය යුතුය.

සතු විය යුතුය. අදාළ භාණ්ඩය විකිණීමෙන් ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.[9]

**නඩු භාණ්ඩ වන වාහන සහ යන්ත්‍රෝපකරණ සම්බන්ධ විශේෂ කාර්යය පටිපාටිය**

10. මෙම කාණ්ඩයේ භාණ්ඩ අතුරින් වාහන සහ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය.

(1)

(අ) මෙම කාණ්ඩයේ භාණ්ඩ (අපරාධය සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය) අතුරින් පුද්ගලයින් සහ විවිධ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට භාවිතා කළ හැකි වාහන[10] (vehicles) සහ යන්ත්‍රෝපකරණත්[11] (equipment) විෂයයෙහි, ඒවාට අදාළ ඉහත සඳහන් ලිඛිත වාර්තාවන්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින නිවැරදිව තිබේ දැයි සෑහීමට පත් වීමෙන් අනතුරුව, මහේස්ත්‍රාත්වරයා විසින් පහත සඳහන් ආකාරයේ බැහැර කිරීමේ නියෝගයක් සිදු කළ යුතු ය.[12]

(ආ) වෝහාරික විමර්ශන සහ වැඩිදුර අපරාධ විමර්ශනවලින් අනාවරණය වන කරුණු සැලකිල්ලට ගත් කළ, අදාළ ඉසව්ගත වාහන සහ යන්ත්‍රෝපකරණ පෞද්ගලික පාර්ශවයකට සන්තකයට භාර දීම යෝග්‍ය නොවන බව මහේස්ත්‍රාත්වරයාට පෙනී යන කළ, එම වාහනය සහ යන්ත්‍රෝපකරණය විෂයෙහි රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එය රාජසන්තක කොට රජයට භාර දීමට පියවර ගනු ලැබිය යුතු ය.

(ඇ) ඉසව්ගත ඉහත (අ) ඡේදයේ සඳහන් වාහනය හෝ යන්ත්‍රෝපකරණය කුලී සින්නක්කර (hire purchase) ගිවිසුමකට හෝ කල්බදු (lease) ගිවිසුමකට යටත් වේ යයි කියනු ලබන අවස්ථාවන්හි දී, හෝ එහි සන්තකය දැරීම පිළිබඳ විවාදයක් පවතින විටෙක, එහි සන්තකය කවර පාර්ශවයකට භාර දිය යුත්තේ ද යන්න තීරණය කිරීම පිණිස විමසීමක් පැවැත්විය යුතුය. අදාළ වාහනයෙහි හෝ යන්ත්‍රෝපකරණයෙහි සන්තකය ලබා ගැනීමට නෛතික හිමිකම ඇත්තේ කවර පාර්ශවයට ද යන්න නිර්ණය කිරීමෙහි දී, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433අ වගන්තියෙහි ප්‍රතිපාදන අදාළ වනු ඇත. ඉහත සඳහන් විමසීම ලඝු කාර්යය පටිපාටියක් ප්‍රකාරව දිවුරුම් පත්‍ර සාක්ෂි සහ ආවේක්ෂා ලේඛනගත සාක්ෂි යොදා ගනිමින් පවත්වනු ලැබිය යුතුය.

(ඈ) යම් වාහනයක් හෝ යන්ත්‍රෝපකරණයක් විෂයෙහි යම්කිසි පෞද්ගලික පාර්ශවයකට නෛතික හිමිකමක් තිබෙන බව එය රාජසන්තක කරනු ලැබීමෙන් අනතුරුව වුව ද ඔප්පු කරනු ලැබිය

---

[9] මේ සඳහා අවශ්‍ය රීතීන් සෑදීමේ බලය යෝජිත පනතින් අධිකරණ සේවා කොමිෂන් සභාවට පැවරිය යුතු අතර, එම බලය ප්‍රකාරව එම රීතීන් එකී කොමිෂන් සභාව විසින් පැනවිය යුතු ය.

[10] 'වාහනයක්' යන්නට මෝටර් වාහනයක්, යාන්ත්‍රික නොවන පුද්ගලයින් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාවිතා කරනු ලබන කරත්ත, තිරික්කල වැනි දෑ, යතුරු පැදි, පා පාදි, පාරු, ඔරු, බෝට්ටු, නෞකා, හෙලිකොප්ටර්, ගුවන් යානා සහ ඩ්‍රෝන යානා ඇතුලත් වේ.

[11] "යන්ත්‍රෝපකරණ" යන වචනය යෝජිත නීතියෙහි අර්ථනිරූපණය කිරීමේ අවශ්‍යතාවයක් කමිටුව නිරීක්ෂණය කරන අතර, ප්‍රායෝගිකව බලන කල එයට බැකෝ යන්ත්‍ර, බුල්ඩෝසර, එස්කැවේටර්, ක්‍රේරේන්, ස්කෑනර් යන්ත්‍ර යනාදිය ඇතුලත් විය යුතු බව කමිටුවේ මතය යි.

[12] මෙම බැහැර කිරීමේ තීරණය ගැනීම සඳහා වෝහාරික විශේෂඥයාගේ වාර්තාව ලැබෙන තෙක් සිටීම අවශ්‍ය නොවන අතර, අදාළ වෝහාරික විශේෂඥයාගේ මතය විමසීමෙන් අනතුරුව සිදු කළ යුතු ය.

හැකිය. එවිට එහි තක්සේරු වටිනාකම ඉහත සඳහන් පාර්ශවයට ප්‍රතිපූර්ණය කරන ලෙසට අධිකරණය විසින් රජයට නියෝග කරනු ලැබිය හැකිය. එසේ නමුදු, ඒ සඳහා වන ඉල්ලීම එකී වාහනයට හෝ යන්ත්‍රෝපකරණයට හිමිකම ඇති පාර්ශ්වය විසින් අනිසි ප්‍රමාදයකින් තොරව කරනු ලැබිය යුතුය.

(2) වාහන සහ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් අතිරේක ප්‍රතිපාදන ද අදාළ වනු ඇත. මෙම කාණ්ඩයේ වාහන/යන්ත්‍රෝපකරණ වර්ග තුනකට බෙදා වෙන් කළ හැකිය.

(අ) ඉසව්ගත වරද අන්තර්ගත නීතියෙහි හෝ ඊට ආනුෂංගික නීතියක ප්‍රතිපාදනවලට අනුව, වරද සිදු කිරීම සම්බන්ධයෙන් යමෙකු වරදකරු කර තිබෙන විටෙක, ඉන් අනතුරුව වරද සිදු කිරීමට භාවිතා කරන ලද වාහන/යන්ත්‍රෝපකරණ රාජසන්තක කළ හැකි අවස්ථා. (Post-conviction confiscation) [උදා:- වන ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත.] මෙම කාණ්ඩයෙහි වාහන/යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් මීට පටහැනිව අදාළ විශේෂ නීතියෙහි කුමක් සඳහන්ව ඇත ද, ඉහත 10(1)(ආ) ඡේදයෙහි ප්‍රතිපාදන ප්‍රකාරව භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් අධිකරණය විසින් කළ යුතුය.

(ආ) යම් වරදක් සිදු කිරීමට භාවිතා කරන ලද වාහන/යන්ත්‍රෝපකරණ, නඩු විභාගය අවසාන වීමට ප්‍රථමයෙන් රාජසන්තක කිරීමට දැනටමත් නෛතික ප්‍රතිපාදන සලස්වා ඇති අවස්ථා. (Confiscation prior to conviction) [උදා - 1978 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝග.] (අංක 1721/2 දරණ 2011.08.29 දිනැති සහ අංක 2123/3 දරණ 2019.05.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර) මේ කාණ්ඩයේ භාණ්ඩ සම්බන්ධයෙන් පවතින ප්‍රතිපාදන ප්‍රකාරව ම කටයුතු කළ හැකිය. නොඑසේ නම්, මෙහි 10(1)(ආ) ඡේදයෙහි සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

(ඇ) ඉසව්ගත අපරාධය සිදු කිරීමට භාවිතා කරන ලද වාහන/ යන්ත්‍රෝපකරණ රාජසන්තක කිරීමට විශේෂිත ප්‍රතිපාදන අදාළ නීතියෙහි සඳහන් ව නොමැති අවස්ථාවන්හි දී, ඉසව්ගත වාහන/ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන්, ඉහත 10(1)(අ) ඡේදයෙහි ප්‍රතිපාදන ප්‍රකාරව භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් අධිකරණය විසින් කළ යුතුය.

**නිකුත් කළ හැකි නියෝගවල ස්වරූපය**

(3) මෙම වාහන/යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි,
(අ) බැඳුම්කරයකට යටත් ව සන්තකය භාර දීම,
(ආ) ස්ථිර ලෙස සන්තකය භාර දීම හෝ,
(ඇ) රාජසන්තක කොට රජයට සන්තකය භාර දීම,
සිදු කරනු ලැබිය හැකිය.

**පවතින නීතියට අනුව නඩු විභාගයෙන් අනතුරුව ඉසව්ගත වාහන/යන්ත්‍රෝපකරණ රාජසන්තක කළ හැකි බවට ප්‍රතිපාදන සලස්වා ඇති අවස්ථා සහ**

(4) ඉහත සඳහන් කාණ්ඩවලට අයත් වාහන/යන්ත්‍රෝපකරණ අතුරින් 10 (2) (අ) සහ 10 (2) (ඇ) කාණ්ඩයේ වාහන/යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන්, පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරනු ලැබිය යුතුය. [ඉහත 10(2)(ආ) කාණ්ඩයේ වාහන/යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදයම ඉදිරියටත් කර ගෙන යා හැකිය.]

රාජසන්තක කිරීමේ ප්‍රතිපාදන සලස්වා නොමැති අවස්ථා

(5) එම වාහන/යන්ත්‍රෝපකරණ විෂයෙහි ව්‍යවහාරික විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව, අප්‍රමාදව එය තක්සේරු කරවා ගෙන එහි වටිනාකම නිර්ණය කර ගැනීම පිණිස තක්සේරු වාර්තාවක් රජයේ තක්සේරු කරුගෙන් හෝ අධිකරණය සමඟ ලියාපදිංචි වී ඇති පිළිගත් තක්සේරුකරුවකුගෙන් ලබා ගත යුතුය.[13] වාහනයෙහි/ යන්ත්‍රෝපකරණයෙහි සන්තකය යම්කිසි පාර්ශවයක් හට භාර දෙන අවස්ථාවේ දී එය තක්සේරු කරවා ගැනීම පිණිස අධිකරණයට තක්සේරුකරුට ගෙවීමට සිදු වූ මුදල එම පාර්ශ්වයෙන් අය කර ගනු ලැබිය යුතුය.

(අ) වාහනයෙහි/යන්ත්‍රෝපකරණයෙහි තක්සේරු වාර්තාව ලැබීමෙන් අනතුරුව, අප්‍රමාදව එය බැහැර කිරීමේ නියෝගයක් මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරනු ලැබිය යුතුය. එම නියෝගය අදාළ ව්‍යවහාරික විමර්ශන සහ වෙනත් පරීක්ෂණ පිළිබඳ වාර්තා අධිකරණයට ලැබීමෙන් මාස හයකට (06) නොවැඩි කාලසීමාවක් ඇතුළත සිදු කිරීමට මහේස්ත්‍රාත්වරයා හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. වාහනයෙහි/ යන්ත්‍රෝපකරණයෙහි තක්සේරු වටිනාකමට සමරූපී වූ යෝග්‍ය කොන්දේසි අන්තර්ගත, සුදුසු බැඳුම්කරයක්[14] මත, අවශ්‍ය වූ විට (නඩු විභාගය අවස්ථාවේ දී) අධිකරණයට ඉදිරිපත් කිරීමේ පොරොන්දුවට යටත්ව, එහි නෛතික හිමිකම [15] ඇති පාර්ශවයට අධිකරණයේ අභිමතය ප්‍රකාරව තාවකාලිකව නිදහස් කිරීම කළ යුතුය.

නඩු විභාගය අවසානයේ දී, එම වාහනය/යන්ත්‍රෝපකරණය රාජසන්තක නොකරනු ලබන විට, බැඳුම්කරයෙහි කොන්දේසි කඩ කර නැති බවට සෑහීමට පත් වීමෙන් අනතුරුව, නඩු විභාගය පවත්වන ලද විනිසුරුවරයා විසින් එය තාවකාලික නිදහස් කිරීම ස්ථිර නිදහස් කිරීමක් බවට පරිවර්තනය කළ යුතුය.

(ආ) මෙම යෝජනාවලියේ මූලික පරමාර්ථවලට අවනතව, අදාළ වාහනය/යන්ත්‍රෝපකරණය නඩු විභාගය අවසාන වනතෙක් එලෙසම තබා ගැනීමට අවස්ථාවෝචිත පරිදි නීතිපතිවරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහේතුක ඉල්ලීමක් වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කර ඇති විට සහ ඊට අදාළ විනිසුරුවරයා එකඟ වී ඇති විටෙක, ඉහත සඳහන් පරිදි අදාළ වාහනය/යන්ත්‍රෝපකරණය බැඳුම්කරයක් මත නඩු විභාගය අවසාන වීමට ප්‍රථමයෙන් කිසියම් පාර්ශවයක සන්තකයට භාරදීම නොකළ යුතුය. තවද, එය රාජසන්තක නොකළ යුතුය. එකී ඉල්ලීමට අදාළ විනිසුරුවරයා එකඟ විය යුත්තේ, ඉසව්ගත වාහනය/යන්ත්‍රෝපකරණය නඩු විභාගය අවසාන වන තෙක් අධිකරණය භාරයේ තබා ගැනීම අපරාධ යුක්තිය පසිඳලීම සඳහා අත්‍යාවශ්‍ය වන බවට සෑහීමකට පත් වුවහොත් පමණි. එවැනි අවස්ථාවන්හි දී, අදාළ වාහනය/ යන්ත්‍රෝපකරණය සුරක්ෂිතව තබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමට හැකි සෑම උත්සාහයක්ම අධිකරණයට ලබා දීමට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා උත්සුක විය යුත්තේය.

---

[13] තක්සේරුකරුවන් ලියාපදිංචි කරවීමේ ක්‍රමවේදය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිර්ණය කළ යුතු අතර, එම ක්‍රමවේදය ක්‍රියාත්මක කොට ඒ ඒ අධිකරණ සඳහා තක්සේරුකරුවන් පත් කිරීමට ද අධිකරණ සේවා කොමිෂන් සභාවට බලය තිබිය යුතුය.

[14] මෙසේ බැඳුම්කරයන් මත නිදහස් කරනු ලබන, යම් වාහනයක් අනුරූප වරද සිදු කිරීම සඳහාම හෝ වෙනයම් තදාන්තර වරදක් (Similar Offence) සිදු කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියකු විසින් භාරයට ගනු ලැබ තිබෙන විට, මුල් පාර්ශවය වෙතටම සන්තකය භාර නොදී එම වාහනය විෂයෙහි මෙහි සඳහන් ව තිබෙන රාජසන්තක කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරනු ලැබිය යුතුය.

[15] නෛතික හිමිකම කවරෙක්ද යන්න පිළිබඳව පවතින නීති තත්ත්වය සංශෝධනය නොකල යුතු බව කමිටුවේ මතය වේ.

පැහැදිලි කිරීම

(i) කිසියම් හේතුවක් නිසා ඉසව්ගත වරද සඳහා පවත්වන ලද නඩු විභාගය අවසානයේ දී මෙහි සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව පෞද්ගලික පාර්ශවයක සන්තකයට භාර දෙන ලද වාහනයක්/ යන්ත්‍රෝපකරණයක් රාජසන්තක කළ යුතු බවට අධිකරණය තීරණය කරනු ලබන විටෙක, බැඳුම්කරය මත භාර දුන් එම වාහනය/ යන්ත්‍රෝපකරණය නැවත අධිකරණයේ භාරයට පත් කරන ලෙසට අධිකරණය විසින් සන්තකය භාර දුන් පාර්ශවයට නියෝග කරනු ලැබිය හැකිය.

(ii) එසේ එම වාහනය/යන්ත්‍රෝපකරණය අධිකරණයට ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවය අසමත් වුවහොත් හෝ වාහනයෙහි/යන්ත්‍රෝපකරණයෙහි වටිනාකම අඩු කිරීම පිණිස සචේතනික ක්‍රියාවක් සිදු කර තිබෙන බව ඒ පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමෙන් අනතුරුව, අධිකරණය තීරණය කරනු ලබන කල්හි, බැඳුම්කරයෙහි සඳහන් වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ වාහනයේ තක්සේරු වටිනාකම අධිකරණයට ගෙවීමට අධිකරණය විසින් නියෝගයක් කරනු ලැබිය හැකි අතර, අදාළ තැනැත්තා එම මුදල ගෙවීමට බැඳී සිටී.

(iii) බැඳුම්කරයක් මත වාහනයක/යන්ත්‍රෝපකරණයක තාවකාලික සන්තකය ලබා ගන්නා ලද තැනැත්තෙක් එහි වටිනාකම අඩු කිරීමට සචේතනික ක්‍රියාවක් සිදු කර තිබෙන විටෙක හෝ එම වාහනය/යන්ත්‍රෝපකරණය අධිකරණ නියෝගයක් ප්‍රකාරව ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබුවහොත්, අධිකරණයට අපහාස කළා යයි සලකමින්, ඒ පිළිබඳ විභාගයක් පැවැත්වීමෙන් අනතුරුව, එම තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය.

(iv) වාහනය/යන්ත්‍රෝපකරණය හෝ එහි තකේස්රු වටිනාකම අධිකරණයේ භාරයට පත් වූ විට, එය රාජසන්තක කිරීමේ නියෝගයක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි අතර, රාජ්‍යය (State) වෙනුවෙන් එය භාර ගන්නා ලෙසට නියම කරනු ලබන තැනැත්තා අප්‍රමාදව වාහනය/යන්ත්‍රෝපකරණය සිය නිල භාරයට ගෙන අදාළ බලධරයාට භාර දිය යුතුය.

(ඇ) වාහනයෙහි/යන්ත්‍රෝපකරණයෙහි තාවකාලික සන්තකය භාරදීමට යෝග්‍ය තැනැත්තෙක් නොමැත්තේ යයි අධිකරණය තීරණය කරනු ලබන අවස්ථාවන්හි දී, එම වාහනය/යන්ත්‍රෝපකරණය රාජසන්තක කරනු ලැබිය හැකිය.

(ඈ) අදාළ වරද සම්බන්ධයෙන් විත්තිකරු වරදකරු කරනු නොලැබූ විට (වාහනය/යන්ත්‍රෝපකරණය රාජසන්තක කළ නොහැකි වන බැවින්), වාහනය/යන්ත්‍රෝපකරණය රජය භාරයේ ඒ වන විට පවතී නම්, එහි තක්සේරු වටිනාකම රජය විසින් වාහනයට/යන්ත්‍රෝපකරණයට නෛතික හිමිකම ඇති පාර්ශවයක් වෙතොත්, එකී පාර්ශවයට ප්‍රතිපූරණය කිරීමට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතුය.

(ඉ) ඉහත සඳහන් ක්‍රමවේදය ප්‍රකාරව බැඳුම්කරයක් මත නිදහස් කර තිබෙන වාහනයක්/ යන්ත්‍රෝපකරණයක් (i) නඩු විභාගය අවස්ථාවේදී එම වාහනය/ යන්ත්‍රෝපකරණය සම්බන්ධයෙන් භෞතික සාක්ෂි ඉදිරිපත් කිරීමට නියමිත විට, හෝ (ii) නඩු විභාගය අවසානයේ දී වාහනය/ යන්ත්‍රෝපකරණය රාජසන්තක කිරීමේ විභාගය සඳහා අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නිවේදනයක් නිකුත් කර තිබෙන අවස්ථාවක දී,

සාධාරණ හේතුවක් නොමැතිව එකී වාහනය/යන්ත්‍රෝපකරණය අධිකරණයට ඉදිරිපත් කිරීම පැහැර හැර තිබෙන විටෙක, අදාළ බැඳුම්කරය අවලංගු කොට, වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ සන්තකය නැවත අධිකරණය විසින් ලබා ගෙන, නඩු විභාගය අවසානයේ දී එය රාජසන්තක කරනු ලැබිය හැකිය. මෙවැනි අවස්ථාවක දී වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ සන්තකය අධිකරණයට ලබා දීම පිණිස පොලිස් නිලධාරියෙකුට බලය පැවරෙන ආඥාවක් අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි අතර, එම ආඥාව ප්‍රකාරව අදාළ පොලිස් නිලධරයාට වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ සන්තකය ලබා ගැනීමේ අධිකාරය ලැබෙනු ඇත.

(ඊ) බැඳුම්කරයක් මත පෞද්ගලික පාර්ශවයකට නිදහස් කර තිබෙන වාහනයක්/යන්ත්‍රෝපකරණයක්, වෙනත් ඉසව්ගත වරදක් හෝ වෙනයම් වරදක් සිදු කිරීමට භාවිතා කර තිබෙන බවට විශ්වාස කිරීමට ප්‍රමාණවත් කරුණු තිබෙන විටෙක, වාහනයේ/යන්ත්‍රෝපකරණයේ සන්තකය අප්‍රමාදව අධිකරණයට නැවත භාර දෙන ලෙසට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකි අතර, ඉහත (ඉ) වන ඡේදයේ ඇති ප්‍රතිපාදන ඊට අදාළ වනු ඇත.

(6) ඉහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් අනතුරුව, වාහනයක්/ යන්ත්‍රෝපකරණයක් රාජසන්තක කරනු ලබන කල, ඒ බව අදාළ විනිසුරුවරයා විසින් සතියක කාලයක් තුළ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙතට දන්වනු ලැබිය යුතුය.

ඉහත සඳහන් දැන්වීම මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ලද විගස, ඉසව්ගත වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ සන්තකය මහා භාණ්ඩාගාරය වෙනුවෙන් භාරගත යුතු රාජ්‍ය නිලධාරියා පත් කරනු ලැබිය යුතු අතර, එම පත් කිරීම අදාළ අධිකරණයට දැන්විය යුතුය.

ලේකම්වරයා විසින් පත් කරන ලද නිලධාරයා විසින් ඉසව්ගත වාහනය/යන්ත්‍රෝපකරණය සති දෙකක (02) කාලසීමාවක් ඇතුළත අදාළ අධිකරණයේ භාරයෙන් ලබා ගෙන, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන ක්‍රියාපටිපාටියට අවනතව එම වාහනය/ යන්ත්‍රෝපකරණය සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

වාහනය/යන්ත්‍රෝපකරණය රාජසන්තක කිරීමේ නියෝගය කරනු ලැබීමෙන් සතියක කාලසීමාවක් ඇතුළත අදාළ වාහනයේ/ යන්ත්‍රෝපකරණයේ පරම අයිතිය ශ්‍රී ලංකා ජනරජය සතු කොට ඇති බවට නිවේදනයක් අදාළ අධිකරණය විසින් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වෙතට දැන්විය යුතු අතර, එහි පිටපතක් පොලිස්පතිවරයාට ද යොමු කරනු ලැබිය යුතුය.

**අවි ආයුධ, ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය**

11. අපරාධ සිදු කිරීමට භාවිතා කර තිබෙන අවි ආයුධ, ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදය වෙනස් කළ යුතු යයි කමිටුව අදහස් නොකරයි.

**භෞතික සාක්ෂිවලට වෛකල්පිකව සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ඉදිරිපත් කිරීම**

12. සාක්ෂි ආඥා පනතේ 60 වන වගන්තියේ 2 වන අතුරු විධානය ප්‍රකාරව අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි කිසියම් ද්‍රව්‍යයක් නඩු විභාගයට ප්‍රථම හෝ නඩු විභාගය අවස්ථාවේ දී මෙහි සඳහන් ක්‍රමවේදය ප්‍රකාරව තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් බැහැර කර තිබෙන විටෙක, මෙහි සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව එම ද්‍රව්‍යයේ විස්තර අන්තර්ගත ලිඛිත වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩිනය එම භාණ්ඩය නඩු විභාගයේ දී අධිකරණයට ඉදිරිපත් කිරීමට වෛකල්පිතව, ප්‍රාථමික සාක්ෂියක් (Primary Evidence)

ලෙසට ආවේශ්‍ය කරගනු ලැබිය හැකිය. ඒ බවට සාක්ෂිමය ප්‍රතිපාදනයක් යෝජිත නීතියට ඇතුළත් කරනු ලැබිය හැකිය.

ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල ආවේශ්‍යතාවයට සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන අදාළ නොවන බව

13. මෙහි සඳහන් ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන ඉසව්ගත හෝ අනුකූල කරුණක සමකාලීන වාර්තාගත කාරණයන් නොවන බැවින් (non-contemporaneous recordings), එම ඡායාරූප සහ වීඩියෝ රෙකෝඩන සාක්ෂි ලෙසට නඩු විභාගයේ දී ඉදිරිපත් කිරීමට සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන අදාළ නොවනු ඇත.

ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල ආවේශ්‍යතාව තීරණය කිරීමේ අභිමතය

14. භෞතික සාක්ෂිවලට වෙකල්පිතව නඩු විභාගයේ දී ඉදිරිපත් කරනු ලබන අදාළ නඩු භාණ්ඩවල ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩනවල ආවේශ්‍යතාවය තීරණය කිරීමේ දී, අධිකරණය ස්වකීය අභිමතය භාවිතා කොට විශ්වසනීය නොවන්නේ යයි පෙනී යන නඩු භාණ්ඩවල ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන වෙතොත්, ඒවා ආවේශ්‍ය කර ගැනීම ප්‍රතික්ෂේප කරන සුදුසු නියෝග හෝ අධිකරණය විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒවා ආවේශ්‍ය කර ගැනීමේ නියෝග සිදු කරනු ලැබිය හැකිය.

වරදවල් සිදු කිරීමට භාවිතා කර තිබෙන පරිගණක, ජංගම දුරකථන ඇතුළු ඉලෙක්ට්‍රොනික උපකරණ විෂයෙහි අනුගමනය කළ යුතු විශේෂ කාර්යය පටිපාටිය

15. මෙම කාණ්ඩයෙහි නඩු භාණ්ඩවලට අයත් වන පරිගණක (computers), ජංගම දුරකථන (mobile phones) සහ වෙනත් ඉලෙක්ට්‍රොනික උපකරණ (other digital devices) විෂයයෙහි පූර්ණ චෝහාරික පරීක්ෂණයක් පවත්වා, එහි ඇතුළත් සියලු දත්ත සහ තොරතුරු චෝහාරික ලෙසට ඉවතට ගෙන (full forensic extraction of data and information), (එනම්, සියලු දත්ත සහ තොරතුරුවල 'චෝහාරික ක්ලෝනයක්'[16] පිළියෙල කර ඇති විටෙක) අදාළ දත්ත සහ තොරතුරු ගබඩා කොට ඇති විටෙක, අදාළ උපකරණය අධිකරණයේ අභිමතය පරිදි එයට නෛතික හිමිකම ඇති පාර්ශවයට කොන්දේසි සහිතව හෝ රහිතව නිදහස් කරනු ලැබිය හැකිය.

[මෙහි සඳහන් වන්නේ, ඉසව්ගත වරද සම්බන්ධයෙන් අපරාධ සහ චෝහාරික විමර්ශන සිදු කරනු ලබන අවස්ථාවේ දී, අනිවාර්යයෙන්ම ගත යුතු පියවරක් නොවන අතර, අදාළ නඩු භාණ්ඩය ඊට නෛතික හිමිකම ඇති පාර්ශවයකට මුදවා හැරීමට පෙර එම භාණ්ඩය බැහැර කිරීමට නියෝගයක් අධිකරණය විසින් සිදු කිරීමට හැකි වනු වස්, ගත යුතු ක්‍රියාමාර්ගයකි.]

ඉහත සඳහන් ආකාරයේ චෝහාරික ක්ලෝනයක් (Forensic Clone) පිළියෙල කොට ඇති විටෙක, සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නඩු විභාගයට පෙර අදාළ පරිගණකය පරීක්ෂා කිරීමට ඉඩ ප්‍රස්තාව ලබා දීම අවශ්‍ය නොවනු ඇත.

16. යෝජිත නීතියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් අනතුරුව, ඒකාබද්ධ අරමුදලට භර කරනු ලබන මුදල්වලින් වසරකට යටත් පිරිසෙයින් 20%ක මුදල් ප්‍රමාණයක් අපරාධ පරීක්ෂණ පැවැත්වීමෙහි වෘත්තීමයභාවය ඉහළ නැංවීම පිණිසත්, ඒ සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍රෝපකරණ ඇතුළු මෙවලම් ප්‍රසම්පාදනය සහ නඩත්තුව පිණිසත් මහා භාණ්ඩගාරයේ ලේකම්වරයා විසින් භාරයේ තබා ගත යුතුය.

[16] "චෝහාරික ක්ලෝනයක්" යන්නෙන් අදහස් කරනු ලබන්නේ, යම් කිසි ඉලෙක්ට්‍රෝනික දත්ත පද්ධතියක නිරවද්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ඉදිරියේ දී නඩු විභාගයක සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීමට හැකි වන අයුරින් එහි පූර්ණ පිටපතක් පිළියෙල කර ගැනීමයි.

17. යෝජිත නීතියෙහි විශේෂයෙන් ප්‍රතිපාදන සලස්වා නොමැති කරුණු සම්බන්ධයෙන්, මෙම යෝජනාවලියේ මුඛ්‍ය පරමාර්ථවලට හානියක් නොවන පරිද්දෙන්, යුක්තිය පසිඳලීමේ අවශ්‍යතාවයන් උදෙසා අවශ්‍ය විය හැකි සුදුසු නියෝග නිකුත් කිරීමේ නෛසර්ගික අධිකරණ පාත්‍රතාවයක් මහාධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ සතු විය යුතුය.

නඩු භාණ්ඩ බැහැර කිරීම සහ විනාශ කිරීම සම්බන්ධයෙන් යෝජිත නීතියෙහි ප්‍රතිපාදන නොමැති විට සහ කිසියම් විෂයය මූලික නීතියක ප්‍රතිපාදන නොමැති කල, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාරව කටයුතු කරනු ලැබිය යුතුය. එසේ කිරීමට එකී පනතෙහි ද ප්‍රතිපාදන නොමැති කල, යුක්තිය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය විය හැකි සුදුසු නියෝගයක් නිකුත් කිරීමේ බලය අදාළ අධිකරණය සතු විය යුතුය

## 2. භාණ්ඩ කාණ්ඩ අංක 2 - යම්කිසි අපරාධයක් සිදු කරන ලද්දේ යම් ද්‍රව්‍යයක් විෂයෙහි නම්, එවැනි ද්‍රව්‍ය (Items in respect of which crimes have been committed.) [උදා: මුදල්, දැව, මැණික්, සොරකම් කරන ලද භාණ්ඩ, අන්තරායකර ඖෂධ, පස්, වැලි, නීතිවිරෝධී මත්පැන්, පුරාවස්තු, වන සත්ව සහ වෘක්ෂලතා ආඥා පනතෙහි සඳහන් වරදවල විෂය වස්තූන් යනාදිය.]

### 2.1 නිරීක්ෂණ -

අනු කාණ්ඩ

1. මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ පහත සඳහන් අනු කාණ්ඩ 05 කට බෙදා වෙන් කළ හැකිය.

   (i) මූල්‍යමය වටිනාකමක් සහිත හෝ රහිත, භාණ්ඩයේ ස්වභාවය අනුව සමාජයට සහ/හෝ පරිසරයට හානි කර වන්නා වූ ද්‍රව්‍ය. (උදා:- විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ, පුපුරණ ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය)

   (ii) භාණ්ඩයේ ස්වභාවය අනුව සමාජයට සහ/හෝ පරිසරයට හානියක් නොමැති, මූල්‍යමය සහ/හෝ වෙනත් විශේෂිත වටිනාකමක් සහිත ද්‍රව්‍ය. (උදා:- මුදල්, වාහන, ගෘහ භාණ්ඩ, ඉලෙක්ට්‍රෝනික උපකරණ, ස්වර්ණාභරණ, අවි ආයුධ, පතොරොම්, පස්, වැලි ඇතුළු ඛණිජ ද්‍රව්‍ය, දැව, පුරාවස්තු, මත්පැන්, ඖෂධ වර්ග)

   (iii) කඩිනමින් නරක් වන හෝ විනාශ වන ආකාරයේ ද්‍රව්‍ය. (උදා:- ආහාර ද්‍රව්‍ය, මස් මාංශ සහ ජෛව කොටස්)

   (iv) කිසියම් පිළිවෙතකට අනුව ආරක්ෂා කර ගත යුතු දේ. (උදා:- සතුන්, ජෛව කොටස්)

   (v) සුවිශේෂී ආරක්ෂක ප්‍රතිපාදන අනුගමනය කරමින් සුරක්ෂිතව තබා ගත යුතු ඉහත කාණ්ඩ 4න් එකකට වැටෙන්නා වූ ද්‍රව්‍ය. (උදා:- මැණික්, ස්වර්ණාභරණ, මුදල්, විකිරණශීලී ද්‍රව්‍ය)

### 2.2 කම්ටුවේ නිර්දේශ:-

භාණ්ඩයේ ස්වභාවය අනුව සමාජයට සහ/හෝ පරිසරයට හානි කර වන්නා වූ ද්‍රව්‍ය

1.

   (1) මෙහි පහත සඳහන් ව්‍යාතිරේඛයන්වලට යටත්ව මෙම කාණ්ඩයේ භාණ්ඩ සම්බන්ධයෙන් ද, 01 වන භාණ්ඩ කාණ්ඩයේ සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. මේ අනුව, අදාළ භාණ්ඩයෙහි විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම, ඡායාරූප ලබා ගැනීම සහ/හෝ වීඩියෝ රෙකෝඩින පිළියෙල කිරීම සිදු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව, 01 වන කාණ්ඩය සම්බන්ධයෙන් නිර්දේශිත ක්‍රියාමාර්ගය පහත සඳහන් ප්‍රතිපාදනවලට යටත්ව අනුගමනය කළ යුතුය.

   (2) මෙම කාණ්ඩයට අයත් ද්‍රව්‍ය ආරම්භයේ දී පෞද්ගලික පාර්ශවයක සන්තකයේ තිබී සොයා ගනු ලැබුවත්, නැතත්, පරිසරයට හෝ කිසියම් පාර්ශවයකට නිදහස් කිරීම යෝග්‍ය නොවන බැවින්, අවශ්‍ය විය හැකි අපරාධ සහ ව්‍යවහාරික පරීක්ෂණවලට ලක් කිරීමෙන් අනතුරුව, අප්‍රමාදව සහ අනුරූප නඩු විභාගය ආරම්භ වීමට ප්‍රථමයෙන්, ඉසව්ගත වරද සම්බන්ධයෙන් අධිකරණ පාත්‍රතාවය ඇති මහේස්ත්‍රාත්වරයාට/ මහාධිකරණ විනිශ්චයකාරවරයාට කරනු ලබන ඉල්ලීමක් ප්‍රකාරව ලබා

ගන්නා ලද අධිකරණ නියෝගයකින්[17] ලද අධිකාරිය ප්‍රකාරව, අප්‍රමාදව නිසි යෝග්‍ය ක්‍රමවේදයක් (appropriate method) අනුගමනය කරමින් විනාශ කරනු ලැබිය යුතුය.[18]

පැහැදිලි කිරීම

(අ) මෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ, අදාළ භාණ්ඩය විෂයෙහි අපරාධ සහ ව්‍යවහාරික පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව,හැකි ඉක්මනින් විනාශ කිරීමට සැලැස්වීමයි.

(ආ) අදාළ ද්‍රව්‍ය බහා තිබූ බහාලුම්, ආවරණ සහ මුද්‍රා නිසි පරිදි අනුරූප නඩු විභාගයේ දී භෞතික සාක්ෂි (real/ physical evidence) ලෙසට ඉදිරිපත් කිරීම පිණිස ආරක්ෂිතව තබා ගත යුතුය.

(ඇ) අදාළ භාණ්ඩය විනාශ කිරීමේ කටයුත්ත අධිකරණ නියෝගය ප්‍රකාරව සිදු වන්නේ ද යන්න පිළිබඳව අධීක්ෂණය කොට අධිකරණයට වාර්තා කිරීම පිණිස සුදුසු නිලධරයකු/ නිලධාරීන් මණ්ඩලයක් හෝ නීතිඥවරයකු පත් කිරීමේ බලය අනුරූප විනිසුරුවරයාට තිබිය යුතුය. අවශ්‍ය වෙතොත් විනිසුරුවරයා විසින් ම භාණ්ඩය විනාශ කිරීමේ කටයුත්ත අධීක්ෂණය කරනු ලැබිය හැකිය.

(ඈ) භාණ්ඩය විනාශ කිරීමේ කටයුත්ත අධිකරණය විසින් භාර දෙන ලද නිලධරයා විසින් අධිකරණ නියෝගය ප්‍රකාරව භාණ්ඩය විනාශ කිරීමෙන් අනතුරුව, අදාළ කටයුත්ත නිසි ආකාරයට සිදු කරන ලද බවට පනතේ උපලේඛනයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් අප්‍රමාදව අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මෙම කාණ්ඩයට අයත් භාණ්ඩයක් විනාශ කිරීම සඳහා නියෝගයක් නිකුත් කිරීමට ප්‍රථම විමර්ශන සහ පර්යේෂණ අවශ්‍යතා, නීත්‍යානුකූල ඖෂධ (medicinal drugs) පිළියෙල කිරීම වැනි අවශ්‍යතාවයන් සඳහා ඒ සඳහා අවසරය දිය හැකි බලධරයකුගෙන් ලද බලපත්‍රයක් ප්‍රකාරව ලබා ගත හැකි සහ සන්තකයේ තබා ගත හැකි මෙම කාණ්ඩයේ ද්‍රව්‍යයක් ඒ සඳහා අයැදුම්කරනු ලබන පාර්ශවයකට කොන්දේසි සහිතව නිදහස් කිරීමේ බලය අදාළ විනිශ්චයකාරවරයා සතු විය යුතුය. මේ ආකාරයේ නියෝගයක් කිරීමට ප්‍රථමයෙන් අදාළ පොලිස් ස්ථානාධිපතිවරයාගේ සහ/හෝ නීතිපතිවරයාගේ නිරීක්ෂණ කැඳවා ඒ කෙරෙහි අවධානය යොමු කොට සුදුසු නියෝගයක් කළ යුතුය.

**විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ**

(3) 2022 අංක 41 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත මඟින් මුල් ආඥා පනතේ 77අ වගන්තියට සිදු කරන ලද සංශෝධනය ප්‍රකාරව එම ආඥා පනතින් නියාමනය කරනු ලබන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ විනාශ කිරීම පිළිබඳව ක්‍රමවේදයක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකඟත්වය සහිතව සාදා රෙගුලාසි පැනවීමේ බලය අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පවරා තිබෙන බැවින්, මෙහි සඳහන් ක්‍රමවේදය විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ ගණයට වැටෙන නඩු භාණ්ඩ සඳහා පනවනු ලැබිය හැකිය.

[17] අවස්ථාවෝචිත පරිදි, නඩු භාණ්ඩය විනාශ කිරීම, ඡායාරූප ගත කිරීම සහ/හෝ වීඩියෝ ගත කිරීම වැනි කොන්දේසි පනවනු ලැබිය හැකිය.

[18] ඒ ඒ ද්‍රව්‍යය විනාශ කිරීමට සුදුසු නිසි යෝග්‍ය ක්‍රමවේදය, ඒ සඳහා අවශ්‍ය විය හැකි විශේෂඥ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, අමාත්‍යවරයා විසින් යෝජිත නීතියෙහි රෙගුලාසි සෑදීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ප්‍රකාශයට පත් කළ යුතුය.

**සමාජයට සහ/හෝ පරිසරයට හානියක් නොමැති, වටිනාකමක් සහිත ද්‍රව්‍ය**

2.

(1) මෙම කාණ්ඩයට අයත් වන ද්‍රව්‍ය යම්කිසි අපරාධයකට ගොදුරු වූ ද්‍රව්‍ය වන බැවින්, ඒවා සම්බන්ධයෙන් නීත්‍යානුකූල හිමිකම දරණ පාර්ශවයක් බොහෝ විට සිටිය යුතුය. එසේහෙයින්, භාණ්ඩ කාණ්ඩ 01 (අපරාධ සිදු කිරීමට භාවිතා කරනු ලබන විවිධ භෞතික ද්‍රව්‍ය) විෂයයෙහි කරන ලද නිර්දේශයන්හි අන්තර්ගත ක්‍රමවේදය වන අදාළ ද්‍රව්‍යයෙහි ස්වරූපය සහ අනෙකුත් විස්තර අන්තර්ගත සවිස්තරාත්මක වාර්තාවක්, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ලබා ගැනීමෙන් අනතුරුව එම ද්‍රව්‍ය සහ එකී වාර්තාව සහ ඡායාරූප යනාදිය අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අවශ්‍ය වෙතොත් ව්‍යවහාරික විමර්ශන පැවැත්වීමෙන් පසුව, අදාළ භාණ්ඩය නඩු විභාගය වනතෙක් තබා ගැනීම අත්‍යාවශ්‍ය නොවන බවට අධිකරණය තීරණය කරනු ලබන කල්හි, අවශ්‍ය වෙතොත් භාණ්ඩයේ වටිනාකම විදහා දැක්වෙන තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එම භාණ්ඩය සන්තක දැරීමට නෛතික හිමිකම සහිත පාර්ශවයට කොන්දේසි සහිතව හෝ රහිතව භාරදිය යුතුය.

(2) මෙම කාණ්ඩයට අයත් භාණ්ඩයක් විෂයෙහි නීතිකෘත්‍ය ආරම්භ කිරීමෙන් අනතුරුව, එකී භාණ්ඩය සන්තකයේ තබා ගැනීමට නීත්‍යානුකූල හිමිකම කියා පාන්නා වූ පාර්ශවයක් භාණ්ඩයේ සන්තකය නැවත ලබා ගැනීම සඳහා අයැදුමක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, පහත සඳහන් ක්‍රියාමාර්ගය අදාළ මහේස්ත්‍රාත්වරයා විසින් අනුගමනය කරනු ලැබිය යුතුය.

(අ) එම භාණ්ඩය විෂයෙහි නීත්‍යානුකූල හිමිකම දරණ පාර්ශවයක් වෙතොත් සහ එහි සන්තකය නැවත ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා අධිකරණයට අයැදුමක් ඉදිරිපත් කළ හැකි බවට භාණ්ඩයේ විස්තරයක් සහිත නිවේදනයක් අධිකරණයෙහි දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය. මෙම දැන්වීම නඩු භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් දින 14ක් ඇතුලත ප්‍රදර්ශනය කළ යුතුය.

(ආ) කිසියම් පාර්ශවයක් අදාළ භාණ්ඩයෙහි නීත්‍යානුකූල හිමිකම ඉල්ලා සිටිමින් අයැදුමක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ පිළිබඳව විභාගයක් පවත්වා භාණ්ඩය එම පාර්ශවයට නිදහස් කිරීම සම්බන්ධයෙන් සුදුසු නියෝගයක් මහේස්ත්‍රාත්වරයා විසින් අප්‍රමාදීව සිදු කරනු ලැබිය යුතුය. (මෙහි දී පලමු වන භාණ්ඩ කාණ්ඩයට අදාළ ව පැවැත්විය යුතු යැයි නිර්දේශ කොට තිබෙන විභාගය අවශ්‍ය වෙනස්කම් සහිතව පැවැත්විය යුතුය.)

(ඇ) ඉහත සඳහන් නිවේදනය ප්‍රදර්ශනය කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුලත කිසියම් පාර්ශවයක් නඩු භාණ්ඩයේ නීත්‍යානුකූල හිමිකම අයැදිමින් ඉල්ලීමක් අධිකරණයට ඉදිරිපත් කරනු නොලැබුව හොත්, එකී නඩු භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කරන ලද පොලීසිය හෝ වෙනයම් නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියක මතය විමසීමෙන් අනතුරුව එම භාණ්ඩය රාජසන්තක කොට එය සන්තකයේ තබා ගැනීමට සහ/හෝ භාවිතා කිරීමට වඩාත් යෝග්‍ය රාජ්‍ය ආයතනයට පැවරිය යුතුය.

පැහැදිලි කිරීම

අදාළ නඩු භාණ්ඩය රජය සතු දේපළක් වන්නේ නම්, එහි සන්තකය නියමිත රාජ්‍ය ආයතනයට නැවත ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමේ හිමිකම එම රාජ්‍ය ආයතනයට හෝ අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා පොලීසියට හෝ නියමිත නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියට තිබිය යුතුය.

**කඩිනමින් නරක් වන හෝ විනාශ වන ආකාරයේ ද්‍රව්‍ය (perishable goods)**

3. කඩිනමින් නරක් වන හෝ පරිහානියට පත් වන හෝ වටිනාකම අඩු වන ද්‍රව්‍ය හැකි ඉක්මනින් ඒවාහි නෛතික හිමිකම ඇති පාර්ශ්වයට හෝ එවැනි පාර්ශ්වයක් හඳුනාගැනීමට නොමැත්තේ නම් හෝ ඉදිරිපත් නොවන්නේ නම්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 431 සහ 432 වන වගන්ති සමඟ කියවිය යුතු 433 වන වගන්තියෙහි ඇති ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. මේ ගණයට අයත් කිසියම් ද්‍රව්‍යයක හිමිකාරීත්වය කිසිඳු පාර්ශ්වයක් නිසි වේලාවට ඉල්ලා නොසිටින කල සහ එම ද්‍රව්‍යයෙහි මහජන සෞඛ්‍යයට හානියක් නොමැත්තේ නම් සහ ඊට වාණිජ වටිනාකමක් ඇත්තේ නම්, පාරිදෘශ්‍ය ක්‍රමවේදයකට අනුව එය මහජන වෙන්දේසියෙහි විකුණා එයට ලැබෙන ප්‍රතිෂ්ටාව නියමිත ගිණුමේ තැන්පත් කිරීමට නියම කිරීමේ බලය මහේස්ත්‍රාත්වරයා සතු විය යුතුය. මීට අමතරව, පාරිභෝගික ආරක්ෂණ අධිකාරී පනතේ 59 වන වගන්තිය, ආහාර පනතේ 15 වන වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23අ වන වගන්තිය වැනි විශේෂිත නීතිවල ඇති ප්‍රතිපාදන ද සුදුසු පරිදි අදාළ කරගනු ලැබිය හැකිය.

**කිසියම් පිළිවෙතකට අනුව ආරක්ෂා කර ගත යුතු දේ**

4. මෙම ගණයට අයත් ද්‍රව්‍ය මෙහි සඳහන් අනිකුත් වර්ගවලට අයත් වන බව නිරීක්ෂණය වේ. එසේ හෙයින්, මේ සඳහා වෙනම ක්‍රමවේදයක් නිර්දේශ කිරීම අවශ්‍ය නොවන අතර, අදාළ වර්ගයට නියමිත ක්‍රමවේදය අවස්ථාවෝචිත පරිදි අනුගමනය කළ යුතු වේ. එසේ නමුදු, අදාළ ද්‍රව්‍ය සුරක්ෂිතව තබා ගැනීම සඳහා අවශ්‍ය පියවර අධිකරණය විසින් තීරණය කළ යුතු වේ. අදාළ ද්‍රව්‍ය ආරක්ෂා කිරීම සඳහා කිසියම් හෝ රාජ්‍ය ආයතනයක සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය නියෝග නිකුත් කිරීමේ බලය මහේස්ත්‍රාත්වරයා සතු විය යුතුය.

**සුවිශේෂී ආරක්ෂක ප්‍රතිපාදන අනුගමනය කරමින් සුරක්ෂිතව තබා ගත යුතු ඉහත කාණ්ඩ 4න් එකකට වැටෙන්නා වූ ද්‍රව්‍ය**

5. මෙම ගණයට අයත් ද්‍රව්‍ය මෙහි සඳහන් අනිකුත් වර්ගවලට අයත් වන බව නිරීක්ෂණය වේ. එසේ හෙයින්, මේ සඳහා වෙනම ක්‍රමවේදයක් නිර්දේශ කිරීම අවශ්‍ය නොවන අතර, අදාළ වර්ගයට නියමිත ක්‍රමවේදය අවස්ථාවෝචිත පරිදි අනුගමනය කළ යුතු වේ. එසේ නමුදු, අදාළ ද්‍රව්‍ය අවශ්‍ය ආරක්ෂක ප්‍රතිපාදන අනුගමනය කරමින් සුරක්ෂිතව තබා ගැනීම සඳහා අවශ්‍ය පියවර අධිකරණය විසින් තීරණය කළ යුතු වේ. අදාළ ද්‍රව්‍ය ආරක්ෂා කිරීම සඳහා කිසියම් හෝ රාජ්‍ය ආයතනයක සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය නියෝග නිකුත් කිරීමේ බලය මහේස්ත්‍රාත්වරයා සතු විය යුතුය.

## 3. භාණ්ඩ කාණ්ඩ අංක 3 – 1 වන සහ 2 වන කාණ්ඩවලට නොවැටෙන, එනමුත් සාක්ෂිමය වටිනාකමක් තිබේ යයි විමර්ශන නිලධාරීන් විශ්වාස කරනු ලබන ද්‍රව්‍ය (Other items that may have evidential value.) [උදා:- වින්දිත පාර්ශවය සහ අපරාධකරු ඇඳ සිටි ඇඳුම් සහ අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද පරිවේශණීය ස්වරූපයක් ගන්නා විවිධ භාණ්ඩ යනාදිය.]

### 3.1 නිරීක්ෂණ -

මෙම කාණ්ඩයට අයත් විය හැක්කේ කවර ද්‍රව්‍ය ද, එවා අපරාධ ස්ථාන පරීක්ෂකවරු/විමර්ශන නිලධාරීන් විසින් සිය භාරයට ගත යුත්තේ ද, නැද්ද යන්න පිළිබඳ නිර්ණායක පිළියෙල කොට ඒවා පිළිබඳ ව නිලධාරීන් දැනුවත් කොට අවශ්‍ය පුහුණුව අවස්ථාවෝචිත පරිදි පොලිස්පතිවරයා විසින් හෝ වෙනත් යම් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක ප්‍රධානියා විසින් ස්වකීය නිලධාරීන් වෙත ලබා දිය යුතුය. මෙම නිර්ණායක පිළියෙල කිරීමේ දී නීතිපතිවරයාගේ සහ අපරාධ විමර්ශන විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීම උචිත වේ.

### 3.2 කමිටුවේ නිර්දේශ:-

**ඉසව්ගත භාණ්ඩ සමඟ අනුරූප සවිස්තරාත්මක වාර්තාව, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩන අධිකරණයට ඉදිරිපත් කිරීම**

1. මෙම කාණ්ඩයේ භාණ්ඩ සම්බන්ධයෙන් ද, භාණ්ඩ කාණ්ඩ අංක 01 විෂයෙහි නිර්දේශ කොට තිබෙන අදාළ භාණ්ඩයෙහි විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම, ඡායාරූප ලබා ගැනීම සහ/හෝ වීඩියෝ රෙකෝඩන ලබා ගැනීම සිදු කළ යුතුය.

**වෝහාරික විමර්ශන විශේෂඥයින් වෙත නඩු භාණ්ඩ යොමු කිරීම සහ අධිකරණයට ඉදිරිපත් කිරීම.**

2. අදාළ භාණ්ඩ විෂයෙහි වෝහාරික විමර්ශන සිදු කරවා ගැනීම අවශ්‍ය වන්නේ නම්, මහේස්ත්‍රාත් අධිකරණය මාර්ගයෙන් හෝ වෙන යම් ලිඛිත නීතියක විශේෂ ප්‍රතිපාදන සලස්වා ඇති අවස්ථාවන්හි දී (උදා:- විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත) එකී නීතියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව අදාළ භාණ්ඩ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත හෝ වෙන යම් වෝහාරික විශේෂඥවරයකු වෙත ඉදිරිපත් කළ යුතුය. වෝහාරික විමර්ශන නිම වීමෙන් අනතුරුව අදාළ භාණ්ඩ ආණ්ඩුවේ රස පරීක්ෂක හෝ වෙන යම් විශේෂඥවරයාගෙන් ලබා ගෙන නැවත මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමේ වගකීම විමර්ශන නිලධාරීන් සතු විය යුතුය.

**නඩු භාණ්ඩ බැහැර කිරීමේ හෝ විනාශ කිරීමේ නියෝග ලබා ගැනීමේ ක්‍රමවේදය**

3. අදාළ නඩු භාණ්ඩ යෝජිත නඩු විභාගයේ දී, භෞතික සාක්ෂියක් ලෙසට ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ද, නොඑසේ නම් භාණ්ඩ බැහැර කිරීමේ නියෝගයක් අධිකරණයෙන් ලබා ගත යුත්තේ ද යන්න තීරණය කිරීමේ අභිමතය විමර්ශන නිලධාරීන් සතු විය යුතු අතර, එම අභිමතය පොලිස්පතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් නිකුත් කොට ඇති නිර්ණායක භාවිතා කරමින් නීතිපතිවරයාගේ උපදෙස්වලට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය. එසේ හෙයින් නඩු විභාගය ආරම්භ වීමට ප්‍රථමයෙන් අදාළ භාණ්ඩය බැහැර කිරීම සඳහා අනිවාර්යයෙන් අධිකරණ නියෝගයක් තිබිය යුතුය. තව ද, මහාධිකරණයෙහි අධි චෝදනා පත්‍රයක් මත විභාග කළ හැකි වරදක් සම්බන්ධයෙන් වන නීති කෘත්‍යයකට අදාළ මෙම කාණ්ඩයේ නඩු භාණ්ඩයක් බැහැර කිරීම සඳහා විමර්ශන නිලධාරීන් විසින් අධිකරණයට ඉල්ලීමක් කළ යුත්තේ ඒ සඳහා නීතිපතිවරයාගේ අවසරය ලබා ගැනීමෙන් අනතුරුව පමණි.

4. **භාණ්ඩ කාණ්ඩ අංක 4 - අපරාධ සිදු කිරීමෙන් සෘජු ලෙස සහ ද්විතියිකව උපයාගනු ලබන දෑ (Proceeds of Crime.) [උදා. සොර බඩු, සොර බඩු විකිණීමෙන් මිල දී ගනු ලබන දේපළ, මත්ද්‍රව්‍ය ජාවාරම්, අල්ලස් ලබා ගැනීම, මුදල් විශුද්ධිකරණය වැනි වරදවල් සිදු කිරීමෙන් ලබා ගන්නා ලද මුදල්වලින් මිල දී ගනු ලබන සහ/හෝ ආයෝජනය කිරීමෙන් ලබන චංචල සහ/හෝ නිශ්චල දේපළ සහ එමඟින් උපයනු ලබන ආදායම යනාදිය.]**

මෙම කාණ්ඩයට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් සුවිශේෂී ගණයේ (*sui generis*) විශේෂ නීතියක් කෙටුම්පත් කළ යුතු බව මෙම කමිටුවේ මතයයි. එය ගරු අධිකරණ අමාත්‍යවරයා වෙත දැන්වීමෙන් අනතුරුව, ඔහු විසින් ඒ සඳහා අදාළ අංශවල විශේෂඥවරුන්ගෙන් සමන්විත වෙනත් කමිටුවක් ස්ථාපනය කර ඇති අතර, එම කමිටුව විසින් ඒ පිළිබඳ ව අධ්‍යයනය මේ වන විට ආරම්භ කොට ඇත.

## 5. භාණ්ඩ කාණ්ඩ අංක 5 – වෝහාරික විමර්ශන අවස්ථාවේ දී වෝහාරික විශේෂඥයින්[19] විසින් ස්වකීය සන්තකයට ගනු ලබන විවිධ නියැදි සහ ආදර්ශ (samples and specimens collected by forensic scientists in the course of conducting forensic investigations), වෝහාරික විශේෂඥයින් විසින් නැවත මහේස්ත්‍රාත් අධිකරණයට හෝ අනුරූප නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ට භාර නොදී සිය සන්තකයේ රඳවා තබා ගනු ලබන භාණ්ඩ සහ සලකුණු[20].

### 5.1 නිරීක්ෂණ -

නියැදි, ආදර්ශ, සලකුණු සහ සමස්ත නඩු භාණ්ඩයම විශේෂඥවරයා විසින් ලබා ගන්නා අවස්ථා

1. මෙම කාණ්ඩයට අයත් වනුයේ,

(1) වෝහාරික විශේෂඥයින් විසින් මෘත දේහයකින් හෝ මෘත දේහයක කොටසක් යැයි සැක කරනු ලබන ද්‍රව්‍යයක් හෝ මෘත දේහයකින් හෝ එහි කොටසකින් ලබා ගනු ලබන නියැදි සහ ආදර්ශ,

(2) වෝහාරික විශේෂඥයකු විසින් අපරාධ ස්ථානයකින් හෝ පරීක්ෂා කිරීමට ඉදිරිපත් කර ඇති යම් භාණ්ඩයකින් සෘජු ලෙස ලබා ගනු ලබන නියැදි සහ ආදර්ශ,

(3) අපරාධයක වින්දිතයකුගෙන්, සැකකරුවකුගෙන් හෝ විමර්ශනයට අදාළව ප්‍රශ්න කිරීමට ලක් කොට ඇති වෙන යම් පුද්ගලයකුගෙන් ලබා ගනු ලබන නියැදි සහ ආදර්ශ,

(4) සත්ත්වයකුගෙන් හෝ ශාකයකින් ලබා ගනු ලබන නියැදි සහ ආදර්ශ,

(5) විමර්ශන නිලධාරීන් විසින් හෝ අපරාධ පරීක්ෂන නිලධාරීන් විසින් එකතු කර ගෙන ඉසව්ගත විශේෂඥවරයාට ඉදිරිපත් කර තිබෙන නියැදි සහ ආදර්ශ,

(6) තොරතුරු සහ දත්තවල (data and information) නියැදි සහ ආදර්ශ,

(7) ඉලෙක්ට්‍රොනික උපකරණ සහ දත්ත ගබඩාවල නියැදි සහ ආදර්ශ,

(8) වෙන යම් විශේෂඥවරයකු විසින් ඉසව්ගත විශේෂඥවරයාට ඉදිරිපත් කර තිබෙන නියැදි සහ ආදර්ශ,

(9) ඉහත කවර හෝ ප්‍රභවයකින් නොඑසේ නම්, කිසියම් ස්ථානයකින් ලබා ගන්නා ඇඟිලි, අතුල්, පතුල් සහ කිසියම් හෝ ශරීරාංගයකින් ලබා ගන්නා සලකුණු,

(10) අත් අකුරු පරීක්ෂකවරයකුට ඉදිරිපත් කරනු ලබන ලේඛන,

(11) කිසියම් පුද්ගලයකුගෙන්, ස්ථානයකින් හෝ වෙනයම් ප්‍රභවයකින් ලබා ගන්නා හඬ වාර්තාගතකනයන් (audio recordings) සහ වීඩියෝ රෙකෝඩනයන් (video recordings)

---

[19] මෙහි දී, වෝහාරික විශේෂඥයන් යන්නෙන් අදහස් කරනු ලබන්නේ, සාක්ෂි ආඥා පනතේ 45 සහ 47 වන වගන්තීන්හි සඳහන් ගණයේ විශේෂඥවරුන් සහ එම වගන්තිය අර්ථකථනය කිරීමේ දී උපරිමාධිකරණ විසින් සපයා ඇති නිර්වචනවලට අයත් වන්නා වූ අනිකුත් තැනැත්තන්ය.

[20] මෙහි 'සලකුණු' යන්නෙන් අදහස් කරනු ලබන්නේ, ඇඟිලි සලකුණු, අතුල් සහ පතුල් සටහන් සහ මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීරයක කොටසකින් ලබා ගන්නා වෙනත් සලකුණු.

යනාදිය වේ.

තව ද විශේෂඥවරයා විසින් ස්වකීය විමර්ශන පැවැත්වීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණයට හෝ එය යොමු කළ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියට භාර නොදී සිය සන්තකයේ රඳවා තබා ගනු ලබන නඩු භාණ්ඩ යනාදිය වේ.[21]

නියැදි, ආදර්ශ, සලකුණු සහ සමස්ත නඩු භාණ්ඩයම බැහැර නොකොට රඳවා තබා ගන්නා අවස්ථා

2. විශේෂඥවරයකු විසින් මෙවැනි නියැදි සහ ආදර්ශ ලබා ගන්නේ හෝ සමස්ත භාණ්ඩයම රඳවා තබා ගැනීමට තීරණය කරනු ලබන්නේ,

(1) වැඩිදුර ව්‍යවහාරික විමර්ශන සඳහා,

(2) වෙනත් ව්‍යවහාරික විශේෂඥවරයකු මාර්ගයෙන් වෙනත් විද්‍යාත්මක ක්ෂේත්‍රයක ව්‍යවහාරික විමර්ශන සිදු කරවා ගැනීම පිණිස,

(3) අනාගතයේ දී සිදු කිරීමට අවශ්‍ය විය හැකි ව්‍යවහාරික විමර්ශන පැවැත්වීම පිණිස,

(4) විද්‍යාත්මක පර්යේෂණ සඳහා සහ අදාළ ක්ෂේත්‍රය අධ්‍යයනය කරනු ලබන අයට සහ විශේෂඥභාවය ලැබීමට පුහුණුවන්නන් හට ඉගැන්වීම සඳහා සහ අධ්‍යයනය කිරීමටය.

## 5.2 කමිටුවේ නිර්දේශ:-

නියැදි, ආදර්ශ, සලකුණු හෝ සමස්ත නඩු භාණ්ඩයම රඳවා තබා ගැනීමේ නියෝග ලබාගැනීමේ ක්‍රමවේදය

1. කිසියම් භාණ්ඩයක නියැදියක් හෝ ආදර්ශයක් අදාළ ඉසව්ගත විශේෂඥවරයා විසින් හෝ ඔහුගෙන් බලයලත් වෙනයම් නිලධරයකු විසින් ලබා ගත් විගස හෝ අවස්ථාවෝචිත පරිදි අනතුරුව එළඹෙන ප්‍රථම අවස්ථාවේ දී ම ආදර්ශය, නියැදිය හෝ සලකුණ ලබා ගැනීම හෝ සමස්ත භාණ්ඩයම රඳවා ගැනීම සම්බන්ධයෙන් අනුරූප මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ප්‍රථම අතුරු වාර්තාවේ හෝ ප්‍රථමයෙන් ම ඉදිරිපත් කරනු ලබන්නේ අවසාන වාර්තාවක් වන අවස්ථාවේ දී, අදාළ නියැදිය, ආදර්ශය හෝ සලකුණ ලබා ගැනීමට හෝ සමස්ත භාණ්ඩයම රඳවා තබා ගැනීමට අදාළව පහත සඳහන් විස්තර මහේස්ත්‍රාත් අධිකරණයට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියට පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

(1) ලබා ගන්නා ලද නියැදියේ හෝ ආදර්ශයේ හෝ රඳවා තබා ගන්නා ලද භාණ්ඩයේ ස්වරූපය;

(2) අදාළ නියැදිය හෝ ආදර්ශය හෝ ඉසව්ගත භාණ්ඩය කවර පුද්ගලයකුගෙන්/ භාණ්ඩයකින්/ ස්ථානයකින් ලබා ගත්තේ ද යන වග;

(3) අදාළ නියැදිය හෝ ආදර්ශය ලබා ගන්නා ලද හෝ අදාළ භාණ්ඩය ලැබුණු දිනය, වේලාව සහ ස්ථානය;

(4) නියැදියෙහි හෝ ආදර්ශයෙහි හෝ භාණ්ඩයෙහි විශේෂ හඳුනාගැනීමේ ලක්ෂණ වෙතොත් ඒවා;

(5) අදාළ නියැදිය හෝ ආදර්ශය හෝ භාණ්ඩය වෙන යම් නිලධරයකුගෙන් ඉසව්ගත විශේෂඥවරයාට ලැබුනේ නම්, එම අවස්ථාව වන විට එම ද්‍රව්‍යවලට කිසියම් අංකනයක් තිබුනේ නම් ඒ පිළිබඳ විස්තර;

---

[21] මෙසේ ලබා ගන්නා ඇතැම් නියැදි සහ ආදර්ශ අනුරූප ව්‍යවහාරික විමර්ශනය සිදු කිරීමත් සමඟ ම එහි මූලික ස්වරූපයම හෝ සමස්තයම ක්ෂය විය හැකිය.

(6) ඉසව්ගත විශේෂඥවරයා විසින් ඒ ඒ නියැදියට හෝ ආදර්ශයට හෝ භාණ්ඩයට ලබා දෙන ලද විශේෂිත අනුක්‍රමික අංකය;

(7) නියැදිය හෝ ආදර්ශය හෝ භාණ්ඩය කවරෙකු විසින් ලබා ගත්තේ ද යන වග;

(8) නියැදිය හෝ ආදර්ශය ලබා ගැනීමට හෝ භාණ්ඩය රඳවා ගැනීමට හේතුව;

(9) අදාළ නියැදිය හෝ ආදර්ශය හෝ භාණ්ඩය කවරෙකු භාරයේ තිබෙන්නේ ද යන වග;

(10) අදාළ නියැදිය හෝ ආදර්ශය හෝ භාණ්ඩය කවරෙකු වෙත කවර හේතුවක් සඳහා භාර දීමට නියමිත ද යන වග; සහ

(11) වෙන යම් අදාළ තොරතුරු.

ඉහත සඳහන් තොරතුරු අධිකරණයට වාර්තා කිරීමට ප්‍රථමයෙන්, එම තොරතුරු සම්බන්ධයෙන් තත්කාලීන සටහන් තැබිය යුතුය.

**මෘත දේහයකින් කිසියම් නියැදියක් හෝ ආදර්ශයක් හෝ ශරීර අංගයක් වෝහාරික විශේෂඥයකු විසින් කවර හෝ පරමාර්ථයක් සඳහා රඳවා තබා ගනු ලැබීම**

2. මෘත දේහයකින් කිසියම් නියැදියක් හෝ ආදර්ශයක් හෝ ශරීර අංගයක් වෝහාරික විශේෂඥයකු විසින් කවර හෝ පරමාර්ථයක් සඳහා රඳවා තබා ගනු ලබන විටෙක, අනුරූප පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට තමන්ට අධිකාරිය පවරන ලද අනුරූප මරණ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාට හෝ මරණ පරීක්ෂකවරයාට ඉහත සඳහන් තොරතුරු වාර්තා කළ යුතුය.

**අපරාධ යුක්තිය පසිඳලීමේ පරමාර්ථයක් නොවන පරමාර්ථයක් සඳහා ආදර්ශය හෝ නියැදිය ලබා ගැනීම**

3. අපරාධ යුක්තිය පසිඳලීමේ පරමාර්ථයක් නොවන පරමාර්ථයක් සඳහා නොඑසේ නම්, වැඩිදුර හෝ ඉදිරි වෝහාරික විමර්ශන සඳහා නොවන හේතුවකට ආදර්ශය හෝ නියැදිය ලබා ගැනීමට වෝහාරික විශේෂඥවරයකු අදහස් කරන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය අදාළ මහේස්ත්‍රාත්වරයාගෙන් ලබා ගත යුතුය.(උදා:- වැඩිදුර අධ්‍යයන සහ පර්යේෂණ පරමාර්ථ සඳහා.) කිසියම් මෘත දේහයකින් වැඩිදුර වෝහාරික විමර්ශන පැවැත්වීම සඳහා නොවන පරමාර්ථයකට කිසියම් ශරීරාංගයක් රඳවා තබා ගැනීමට තීරණය කරනු ලබන කල, ඒ සඳහා පූර්ව අවසරය මහේස්ත්‍රාත්වරයාගෙන් ලබා ගැනීමට අමතරව, ඊට කැමැත්ත අදාළ තැනැත්තාගේ ළඟම නෑයා (next of kin) හෝ ඔහු නොමැත්තේ නම් මියගිය තැනැත්තාගේ ආසන්නතම ඥාතියකුගෙන් සෘජු ලෙස හෝ අදාළ මහේස්ත්‍රාත් අධිකරණය හරහා ලබා ගත යුතුය. ඉසව්ගත මිය ගිය තැනැත්තා ස්වකීය ශරීරාංග අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සඳහා ලබා දීමට ජීවත්ව සිටිය දී කැමැත්ත ප්‍රකාශ කර තිබෙන විටෙක, ළඟම ඥාතියාගේ කැමැත්ත විමසීම අවශ්‍ය නොවේ.[22] අදාළ තැනැත්තා ජීවත්ව සිටිය දී ස්වකීය ශරීරාංග අධ්‍යයන හෝ පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන විටෙක ඔහුගේ ශරීරාංග වෝහාරික විමර්ශන නොවන පරමාර්ථ සඳහා ලබා නොගත යුතුය.

**වෝහාරික විමර්ශනයේදී**

4. කිසියම් අවස්ථාවක දී, වෝහාරික විමර්ශනයක් පැවැත්වීම සම්බන්ධයෙන් ඡායාරූප ගනු ලබන්නේ ද, නොඑසේනම්, වීඩියෝ රෙකෝඩින ලබා ගන්නේ ද,

[22] 1987 අංක 48 දරණ මනුෂ්‍ය පට බද්ධ කිරීමේ පනත.

**ලබාගනු ලබන ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින පිළිබඳ විස්තරාත්මක සටහන්**

ඒ පිළිබඳ විස්තරාත්මක තත්කාලීන සටහන් තැබීම අවශ්‍ය වේ. තව ද, ඒ පිළිබඳ සඳහනක් ස්වකීය විශේෂඥ වාර්තාවට ඇතුලත් කරනු ලැබිය යුතුය. නඩු පැවරීමට තීරණයක් ගනු ලබන අවස්ථාවේ දී නීතිපතිවරයාටත්, නඩු පවරනු ලැබීමෙන් අනතුරුව අනුරූප අධිකරණයටත් ඒවාහි පිටපත් ඉදිරිපත් කිරීමට අදාළ විශේෂඥවරයා සූදානමින් සිටිය යුතුය.[23]

**වෝහාරික විශේෂඥවරයකු විසින් ලබා ගන්නා ලද නඩු භාණ්ඩයක් නියැදියක් හෝ ආදර්ශයක් බැහැර කිරීමට අවශ්‍ය වන විට නියෝග ලබාගැනීමේ ක්‍රමවේදය**

5. වෝහාරික විශේෂඥවරයකු විසින් ලබා ගන්නා ලද කිසියම් නඩු භාණ්ඩයක් නියැදියක් හෝ ආදර්ශයක් ඔහු විසින් බැහැර කිරීමට තීරණය කර තිබෙන විටෙක, එම තීරණය ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් අදාළ නඩු භාණ්ඩය පරීක්ෂා කරන ලෙසට තමනට නියම කරන ලද මහේස්ත්‍රාත්වරයාගේ හෝ අදාළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි අවසර ලබා ගත යුතුය. කිසියම් මෘත දේහයකින් ලබා ගන්නා ලද නියැදියක් හෝ ආදර්ශයක් හෝ ශරීරාංගයක් බැහැර කිරීමට තීරණය කර ඇති විටෙක, ඒ සඳහා අවසරය පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට අධිකාරිය පවර ලද මහේස්ත්‍රාත්වරයාගේ, අදාළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි හෝ හදිසි මරණ පරීක්ෂකවරයාගේ අවසරය ලබා ගත යුතුය

**1988 අංක 69 දරන ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනතෙහි ප්‍රතිපාදන**

6. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යොමු කරනු ලබන නඩු භාණ්ඩ අනුරූප වෝහාරික විමර්ශනය අවසානයේ දී විනාශ කිරීම සම්බන්ධයෙන් 1988 අංක 69 දරන ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාට බලය තිබිය යුතු අතර, ඒ ප්‍රකාරව කටයුතු කිරීම අප්‍රමාදව ආරම්භ කළ යුතුය.

**වෝහාරික විශේෂඥවරයකු සන්තකයේ තිබෙන නඩු භාණ්ඩයන්හි ආරක්ෂාව තහවුරු කිරීම**

7. වෝහාරික විශේෂඥවරයකුගේ සන්තකයේ තිබෙන කිසියම් නඩු භාණ්ඩයක හෝ නියැදියක, ආදර්ශයක හෝ සලකුණක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වකීය සම්පත් ප්‍රමාණවත් නොවන අවස්ථාවන් හි දී ඒ සඳහා අවශ්‍ය අතිරේක සම්පත් අදාළ අධිකරණය මාර්ගයෙන් නිසි රාජ්‍ය ආයතනයෙන් ලබා ගැනීමට හැකියාව තිබිය යුතුය.[24]

---

[23] මෙම ප්‍රතිපාදනය හේතුවෙන් කිසියම් හෝ වෝහාරික විමර්ශනයක් සිදු කිරීමේ දී එය ඡායාරූප ගත කිරීමට සහ/හෝ එහි වීඩියෝ රෙකෝඩින පිළියෙල කිරීමේ නෛතික බැඳියාවක් හට නොගනී.

[24] මෙහි දී ආරක්ෂාව යන්නෙන් අදහස් කරන්නේ, භෞතික ආරක්ෂාව පමණක් නොවේ. කිසියම් විශේෂ තත්ත්වයන් (special condition) යටතේ තබා ගත යුතු නඩු භාණ්ඩ වේ.

## 6. භාණ්ඩ කාණ්ඩ අංක 6 – වෝහාරික ඩී.එන්.ඒ. (DNA) පරීක්ෂණ පැවැත්වීම පිණිස වෝහාරික විශේෂඥයින් වෙතට යොමු කරනු ලබන සහ එම විශේෂඥවරු විසින්ම හෝ ඔවුන් වෙනුවෙන් ලබා ගන්නා, (i) ජෛව සාම්පල[25] (biological samples), (ii) ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය[26], (iii) ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස එකතු කර ගනු ලබන සත්ත්ව සහ ශාක කොටස්, සහ (iv) ඩී.එන්.ඒ. රටාවන් (DNA profiles).

### 6.1 නිරීක්ෂණ -

**ප්‍රතිපාදයන්හි අදාලත්වය**

1. මෙම කොටසෙහි ඇති ප්‍රතිපාදන විශේෂයෙන් අදාළ වන්නේ, ජෛව සාම්පල ලබා ගනු ලබන විමර්ශන නිලධාරීන්ට සහ DNA පරීක්ෂණ පවත්වනු ලබන වෝහාරික විශේෂඥයින් ට ය.

   මීට අමතරව, ඩී.එන්.ඒ. දත්ත ගබඩා ඇතුළු ඩී.එන්.ඒ. පරීක්ෂණාගාර කළමනාකරණය කරනු ලබන නිලධාරීන්ටත්, ඩී.එන්.ඒ. වෝහාරික පරීක්ෂණ පැවැත්වීමට ආනුෂංගික රාජකාරීවල නිරත වන අයටත්, මෙම ඡේදයෙහි ඇතුලත් ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**සුවිශේෂී නීතියක අවශ්‍යතාවය**

1. වෝහාරික DNA පරීක්ෂණ පැවැත්වීම පිණිස,

   (1) ජෛව සාම්පල සහ ජෛව සාම්පල තිබිය හැකි යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය ලබා ගැනීමේ දී සහ ඩී.එන්.ඒ. රටාවන් (DNA profiles) කළමනාකරණය කිරීම,

   (2) එම සාම්පල ඩී.එන්.ඒ. විශේෂඥයින් වෙත යොමු කිරීම,

   (3) එම සාම්පල අනුසාරයෙන් ඩී.එන්.ඒ. රටාවන් පිළියෙල කිරීම,

   (4) වෝහාරික පරීක්ෂණ සඳහා ඩී.එන්.ඒ. රටාවන් භාවිතා කිරීම,

   (5) ඩී.එන්.ඒ. රටාවන් සන්තකයේ තබා ගැනීම,

   (6) ජෛව සාම්පල බැහැර කිරීම,

   (7) වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණ සිදු කිරීමෙන් ලබා ගන්නා දත්ත සහ තොරතුරු අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයේ අවශ්‍යතාවයන් සඳහා සහ වෙනත් නීත්‍යානුකූල කටයුතු සඳහා භාවිතා කිරීම,

   (8) ස්වාධීන ජාතික වෝහාරික ඩී.එන්.ඒ. දත්ත ගබඩාවක් ස්ථාපනය කිරීම සහ එය නියාමනය කිරීම,

   (9) ඩී.එන්.ඒ. රටාවන් පිළියෙල කිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය වන හෝ ක්ෂය විය හැකි ජෛව සාම්පලවලට අදාළ ව ගත යුතු පියවර,

   (10) වෝහාරික ඩී.එන්.ඒ. වාර්තාව සහ එහි අන්තර්ගත තොරතුරු අධිකරණයටත්, නීතිපතිවරයාටත්, විමර්ශන නිලධාරීන්ටත්, අතිරේකව වෙනත් පාර්ශ්වවලට අනාවරණය කිරීම,

---

[25] රුධිර සාම්පල, හිසකෙස්, චර්ම කොටස් යනාදිය.

[26] රුධිරය යයි විශ්වාස කරන ද්‍රව්‍යයක් රෙදි කැබැල්ලක, දෘඪ පෘෂ්ඨයක් මත තිබෙන අවස්ථා

(11) වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණාගාර රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පවත්වා ගෙන යාම සඳහා නෛතික අවසරය සහ ලියාපදිංචිය ලබා ගැනීම සහ එවැනි පරීක්ෂණාගාරවල කටයුතු නියාමනය කිරීම,

(12) ඊට ආනුෂංගික වෙනත් කරුණු,

නියාමනය කෙරෙන විශේෂිත නීතියක අවශ්‍යතාවය මෙම කමිටුව නිරීක්ෂණය කරයි. එවැනි නීතියක නෛතික සහ ප්‍රතිපත්ති රාමුව අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් විසින් කඩිනමින් පිළියෙල කළ යුතු බව මෙම කමිටුවේ අදහසයි. එවැනි නීතියක් සම්මත කරන තෙක්, පහත සඳහන් ප්‍රතිපත්ති ඩී.එන්.ඒ. විශේෂඥයින් සහ මෙම පරිච්ඡේදයෙහි ප්‍රතිපාදන අදාළ වන්නා වූ ඉහත සඳහන් අනිකුත් කාණ්ඩවල නිලධාරීන් විසින් ද අනුගමනය කළ යුතු බව මෙම කමිටුවේ මතයයි.

## 6.2 කමිටුවේ නිර්දේශ:-

වාර්තාවේ මෙම කොටසෙහි අන්තර්ගත පියවර සහ මූලධර්ම හැකිතාක් දුරට ඒ ආකාරයෙන් ඩී.එන්.ඒ. විශේෂඥවරුන් විසින් ජෛව සාම්පල සහ ඩී.එන්.ඒ. රටාවන් සම්බන්ධයෙන් ද අනුගමනය කළ යුතුය.

**ජෛව සාම්පල, ඒ ආශ්‍රයෙන් පිළියෙල කරනු ලබන ඩී.එන්.ඒ. රටාවන් සහ ආනුෂංගික දත්ත සහ තොරතුරුවල සුපිළිපන් බව, පෞද්ගලිකත්වයත්, ආරක්ෂාව**

1. වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණ පැවැත්වීම සඳහා ඩී.එන්.ඒ. විශේෂඥවරුන් හට ලැබෙන ජෛව සාම්පල, ඒ ආශ්‍රයෙන් පිළියෙල කරනු ලබන ඩී.එන්.ඒ. රටාවන් සහ ආනුෂංගික දත්ත සහ තොරතුරුවල සුපිළිපන් බව (integrity), අනුරූප දත්ත සහ තොරතුරුවලත් ඒවාහි අයිතිකරුවන්ගේ පෞද්ගලිකත්වයත් (privacy) සහ අනුරූප දත්ත සහ තොරතුරුවල ආරක්ෂාව (security), ඩී.එන්.ඒ. විශේෂඥයින් විසින් වග බලා ගත යුතුය. මෙසේ කිරීමේ දී ජාත්‍යන්තරව පිළිගත් නිර්ණායක සහ ප්‍රමිතීන්වලට අනුව කටයුතු කළ යුතු වේ.[27]

**ඩී.එන්.ඒ. රටාවන්හි සුපිළිපන් බව ආරක්ෂා කිරීම**

2. ඩී.එන්.ඒ. රටාවන්හි සුපිළිපන් බව (integrity) ආරක්ෂා කිරීම සඳහා ඩී.එන්.ඒ. විශේෂඥවරුන් විසින් ගත හැකි ප්‍රධානතම පියවර වන්නේ, අනුරූප ජෛව සාම්පලය ඔවුන් ලද සැනින් ඩී.එන්.ඒ.රටාවන් පිළියෙල කර ගැනීමය

**2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ අදාලත්වය**

3. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි ඩී.එන්.ඒ. විශේෂඥයින්ට සහ ඩී.එන්.ඒ. පරීක්ෂණවලට අදාළ වන ප්‍රතිපාදනවලට අනුව කටයුතු කිරීමට ඩී.එන්.ඒ. විශේෂඥයින් බැඳී සිටී.

**ජෛව සාම්පල, ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය සහ ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරනු**

4. වෝහාරික ඩී.එන්.ඒ. විමර්ශන පැවැත්වීම සඳහා වෝහාරික විශේෂඥයින් වෙත යොමු කරනු ලබන ජෛව සාම්පල, ජෛව සාම්පල තිබේ යයි අනුමාන කරනු ලබන වෙනත් භෞතික ද්‍රව්‍ය සහ ඩී.එන්.ඒ. ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලබන සත්ත්ව සහ ශාඛ කොටස්වලින් ඩී.එන්.ඒ. ලබා ගැනීමෙන් අනතුරුව හෝ ඩී.එන්.ඒ. ලබා ගැනීමට නොහැකි බවට සෑහීමකට පත් වීමෙන් අනතුරුව, එම භෞතික ද්‍රව්‍යයන්හි වෙනත් වෝහාරික වටිනාකමක් හෝ සාක්ෂිමය වටිනාකමක් තිබේ ද යන්න අදාළ විමර්ශන නිලධාරීන්ගෙන් මහේස්ත්‍රාත් අධිකරණය හරහා අනාවරණය කර ගැනීමෙන්

[27] උදා :- ISO 17025.2017 ප්‍රමිතිය.

**ලබන සක්ත්ව සහ ශාඛ කොටස් බැහැර කිරීම**

අනතුරුව, වෝහාරික විශේෂඥයින් විසින් විනාශ කිරීමට පියවර ගත යුතු ය. එනමුදු එසේ කිරීමට ප්‍රථමයෙන් එසේ විනාශ කරනු ලබන ද්‍රව්‍යයන්හි පූර්ණ විස්තරයක් ඇති වාර්තාවක් පිළියෙල කළ යුතු අතර, ඒවාහි ඡායාරූප ද ලබා ගත යුතුය. එසේ පිළියෙල කරනු ලබන වාර්තාව සහ ඡායාරූප අදාළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණ පැවැත්වීම සඳහා වැය වන මුදල අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළින්ම ඉපයීම**

5. අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයේ පරමාර්ථ සාර්ථක ලෙස මුදුන්පත් කර ගැනීම පිණිස, වෝහාරික ඩී.එන්.ඒ. පරීක්ෂණ ඉදිරියටත් පැවැත්වීමට සැලැස්වීම ඉතා අවශ්‍ය බව කමිටුව නිරීක්ෂණය කරයි. මෙම පරීක්ෂණ පැවැත්වීම සඳහා විශාල වැය බරක් දැරීමට සිදු වීම කෙරෙහි අවධානය ලක් කරන ලද මෙම කමිටුව යෝජනා කරනු ලබන්නේ, මෙවැනි පරීක්ෂණ පැවැත්වීම සඳහා වැය වන මුදල අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළින්ම ඉපයීමේ ක්‍රමවේදයක් තිබිය යුතු බවයි. මේ සඳහා විත්තිකරුවන් වරදකරු කිරීමෙන් අනතුරුව, දඩුවමක් ලෙසට නියම කරනු ලබන දඩ මුදල අය කර ගනු ලැබීමෙන් අනතුරුව අධිකරණවලට ලැබෙන මුදල්වලින් යම් ප්‍රතිශතයක් අධි තාක්ෂණික වෝහාරික පරීක්ෂණ පැවැත්වීම සඳහා භාවිතා කිරීම යෝග්‍ය වන බව කමිටුවේ මතයයි.

7. භාණ්ඩ කාණ්ඩ අංක 7 – ඉහත කිසිදු කාණ්ඩයකට අයත් නොවන, අපරාධ විමර්ශන අවස්ථාවේ දී එකතු කරගන්නා ලද හෝ සොයා ගනු ලබන හිමිකරුවකු නොමැති බව පෙනී යන්නා වූ කිසියම් මුදලක් හෝ චංචල හෝ නිශ්චල දේපළක් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක තාවකාලික භාරයට ගෙන අධිකරණයට භාර දීමෙන් හෝ වාර්තා කිරීමෙන් අනතුරුව, අධිකරණය විසින් නැවත එම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයටම භාර දෙනු ලබන ද්‍රව්‍ය (උදා:- සැකකරුගේ සන්තකයේ තිබී භාර ගනු ලබන පෞද්ගලික භාණ්ඩ සහ හිමිකරුවකු නොමැති බව පෙනී යන හෝ හිමිකාරීත්වය ප්‍රතික්ෂේප කරනු ලබන ද්‍රව්‍ය - Suspect's personal property and property in respect of which there is either no claimant or ownership is denied)

### නිරීක්ෂණ සහ කමිටුවේ නිර්දේශ

1. කිසියම් සැකකරුවකුගේ සන්තකයේ තිබී හමු වන අපරාධ සිදු කිරීමෙන් උත්පාදනය කරගෙන තිබේ යයි පෙනී යන මුදල් ප්‍රමාණයක් හෝ චංචල හෝ නිශ්චල දේපළක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ඊට අදාළ නීතියේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කරනු ලැබිය යුතුය.

2. සැකකරුවකුගේ සන්තකයේ තිබී හමු වන ඔහුගේ හෝ තුන්වන පාර්ශ්වයක පෞද්ගලික දේපළ වේ නම්, ඒවා මහේස්ත්‍රාත් අධිකරණය හරහා ඊට හිමිකම ඇති පාර්ශ්වයට භාර දීම සැකකරු අධිකරණයට භාර දීමට කටයුතු කරනු ලබන නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ බලයලත් නිලධාරියා විසින් කටයුතු කරනු ලැබිය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන දේපළවල ලැයිස්තුවක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 හෝ 116 වගන්තිය ප්‍රකාරව පිළියෙල කර තිබෙන වාර්තාවක ඇතුළත් කර තිබිය යුතුය.

3. ඉහත 01 සහ 02 ඡේදවල සඳහන් භාණ්ඩ සහ මෙම වාර්තාවේ අන්තර්ගත අනිකුත් කාණ්ඩවලට ද අයත් නොවන වෙනයම් දේපළ වේ නම්, ඒවා කඩිනමින් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඒවාට හිමිකම ඇති පාර්ශ්වවලට භාර දීමට ඒවා භාරයට ගත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ බලයලත් නිලධාරියා විසින් පියවර ගත යුතුය. සාධාරණ කාලයක් ඇතුළත එම ද්‍රව්‍යවල හිමිකම කිසියම් හෝ පාර්ශ්වයක් විසින් අධිකරණය හමුවේ කියා පාන්නේ නැති අවස්ථාවක දී සහ හිමිකම තිබේ යැයි විමර්ශන නිලධාරීන් විසින් කියාපාන පාර්ශ්වය ස්වකීය හිමිකම ප්‍රතික්ෂේප කරන්නේ නම්, අදාළ ද්‍රව්‍යය, අපරාධ තුලින් උපයනු ලබන දේපල සම්බන්ධයෙන් වන නීතින්හි (Law relating to Proceeds of Crimes) ප්‍රතිපාදනවලට යටත් ව ප්‍රසිද්ධ වෙන්දේසියෙහි පාරදෘශ්‍ය ක්‍රමවේදයකට අනුව අධිකරණය විසින් හෝ අධිකරණය විසින් බලය පවරනු ලබන පාර්ශ්වයක් විසින් විකුණා, ප්‍රතිෂ්ටාව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර මහේස්ත්‍රාත් අධිකරණය විසින් ගත යුතුය. එසේ ප්‍රතිෂ්ටාව බැර කිරීමෙන් අනතුරුව, කිසියම් පාර්ශ්වයක් විසින් ඉහත සඳහන් ද්‍රව්‍යය පිළිබඳ හිමිකම සද්භාවයෙන් ගෙන හැර පැවොත් සහ එවැනි ඉල්ලීමක් කිරීමට ප්‍රමාදය සාධාරණීකරණය කළහොත්, ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල එකී පාර්ශ්වයට ගෙවන ලෙසට අධිකරණය විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට නියම කරනු ලැබිය හැකිය.

## 8. භාණ්ඩ කාණ්ඩ අංක 8 – විවිධ ස්ථානවල තිබී සොයා ගන්නා ලද, පොලිස් නිලධාරීන් ඇතුළු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය භාරයට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන, අයිතිකරුවකු සොයා ගැනීමට නොහැකි බවට පෙනී යන භාණ්ඩ (උදා. අයිතිකරුවෙකු නොමැතිව හෝ සැකකරුවෙකු නොමැතිව සොයා ගනු ලබන දේපළ, දැව හා රත්තරං භාණ්ඩ සහ වෙනත් වටිනා දේපළ)

### නිරීක්ෂණ සහ කමිටුවේ නිර්දේශ

1. අයිතිකරුවකු නොමැතිව විවිධ ස්ථානවල තිබී සොයා ගන්නා ලද භාණ්ඩ වේ නම්, ඒවා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433 වගන්තියේ ප්‍රකාරව විකුණා දැමීමේ විධිවිධාන මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දිය යුතු වේ.

2. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමෙන් අනතුරුව, විකුණා දැමීමෙන් ලැබෙන ප්‍රතිෂ්ටාව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් අනතුරුව, කිසියම් පාර්ශ්වයක් විසින් ඉහත සඳහන් ද්‍රව්‍යය පිළිබඳ හිමිකම සද්භාවයෙන් ගෙන හැර පෑවොත් සහ එවැනි ඉල්ලීමක් කිරීමට ප්‍රමාදය සාධාරණීකරණය කළහොත්, ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල එකී පාර්ශ්වයට ගෙවන ලෙසට අධිකරණය විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට නියම කරනු ලැබිය හැකිය.

යෝජිත නීතියට අදාළ විශේෂ කරුණු සහ වෙනත් නිර්දේශ -

1. සමස්තයක් ලෙස, මෙහි සඳහන් ප්‍රතිපාදන කෙටුම්පත් කොට ඇත්තේ ඉසව්ගත අපරාධ විමර්ශනය පොලිස් නිලධාරීන් විසින් කරනු ලබන්නේ ය යන්න පදනම් කරගෙනය. එසේ නමුදු, පවතින නීතියට අනුව ඇතැම් විමර්ශන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන්, සුරාබදු නිලධාරීන්, වන නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරික්ෂකවරු ඇතුළු විවිධ නීතීන්වලින් බලය ලද නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. එවැනි පොලිස් නිලධාරීන් නොවන නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් පවත්වනු ලබන විමර්ශනවල දී මෙකී නිර්දේශවල පොලිස් නිලධරයකුගේ කාර්යය භාරය සඳහන් ව ඇති අවස්ථාවන්හි දී එය අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙහි බලය ලත් නිලධාරයකුගේ කාර්යය භාරය ලෙසටත්, පොලිස්පතිවරයාගේ කාර්යය භාරය සඳහන් ව ඇති අවස්ථාවන්හි දී එකී නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්හි ප්‍රධානියාගේ කාර්යය භාරය ලෙසට අර්ථ ගැන්විය යුතුය. තව ද, සාමාන්‍ය ක්‍රියා කලාපයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් නීති උපදෙස් ගනු ලබන්නේ, එකී කොමිෂන් සභාවේ නියමයන්වලට යටත් ව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගෙන් බැවින්, මෙම යෝජනාවලියෙහි නීතිපතිවරයා යන්න සඳහන් ව ඇති අවස්ථාවන්හි දී එය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විෂයෙහි සඳහනක් ලෙසට සැලකිය යුතුය.

2. මෙහි අන්තර්ගත ප්‍රතිපත්ති සහ නෛතික රාමුව පදනම් කරගෙන නඩු භාණ්ඩ කළමනාකරණය කිරීම සහ බැහැර කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම වස්, නව **විෂයානුබද්ධ විශේෂ පනතක් කෙටුම්පත් කිරීම** අත්‍යාවශ්‍ය වේ. එහි පළමු වන කොටසට මෙහි සඳහන් නඩු භාණ්ඩ වර්ගීකරණය ඇතුළත් කළ යුතු අතර, එහි දෙවන කොටසට භාණ්ඩ වර්ග සම්බන්ධයෙන් මෙම වාර්තාවෙහි නිර්දේශිත ක්‍රමවේදය උචිත නෛතික වගන්ති ආකාරයට ඇතුලත් කරනු ලැබිය යුතුය.

3. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ද වෙනත් ඇතැම් නීතීන්වල ද, නඩු භාණ්ඩ සම්බන්ධයෙන් විවිධ නෛතික ප්‍රතිපාදන තිබේ. එසේ හෙයින්, එකී ප්‍රතිපාදන සහ යෝජිත නීතියෙහි ප්‍රතිපාදන අතර කිසියම් අනනුකූලභාවයක් තිබෙන අවස්ථාවන්හි දී, යෝජිත නීතියෙහි ප්‍රතිපාදනයන් බලාත්මක වීම වස් සුදුසු ප්‍රතිපාදනයක් යෝජිත නීතියට ඇතුලත් කරනු ලැබිය යුතුය.

4. මෙම නව පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරනු වස්, අවශ්‍ය විය හැකි ආනුෂංගික ප්‍රතිපාදන අමාත්‍යවරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන සෑදිය හැකි අතර, පාර්ලිමේන්තුව විසින් එම රෙගුලාසි අනුමත කිරීමෙන් අනතුරුව බලාත්මක වනු ඇත.

5. 1988 අංක 69 දරන ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනතෙහි ප්‍රතිපාදන වහාම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ යුතුය. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් විශ්ලේෂණය කොට වාර්තා පිළියෙල කොට ඇති අවස්ථාවන්වලට අදාළ ව නඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් එම දෙපාර්තමේන්තුවෙහි ඒකරාශී වී ඇති හෙයින්, ඉහත සඳහන් පනතේ ප්‍රතිපාදන අප්‍රමාදව ක්‍රියාත්මක කරන ලෙසට මහේස්ත්‍රාත්වරුන්ට නිර්දේශ කරන ලෙසට අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලෙසටත්, අනවශ්‍ය නඩු භාණ්ඩ එකී පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව විනාශ කිරීමට පියවර ගන්නා ලෙසට ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාට දන්වන ලෙසටත් නිර්දේශ කරමු.

6. දැනට මහාධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයන් තුළ තිබෙන නඩු භාණ්ඩ විෂයයෙහි විගණනයක් පවත්වා, නඩු විභාගවලට අවශ්‍ය විය හැකි හෝ නොහැකි සියලුම භාණ්ඩවල සවිස්තරාත්මක වාර්තා, ඡායාරූප සහ/හෝ වීඩියෝ රෙකෝඩින ලබා ගෙන අප්‍රමාදව බැහැර කිරීමේ සහ/හෝ විනාශ කිරීමේ නියෝග මෙහි සඳහන් ප්‍රතිපාදන නීතිගත කිරීමෙන් අනතුරුව, එම නීතියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය. ඒසේ නමුදු, එකී විගණනයෙන් මේ වන විට විත්තිකරු වරදකාරීත්වය පිළිගෙන ඔහු ව වරදකරු කර තිබෙන නඩුවලට අදාළ නඩු භාණ්ඩ තිබේ නම්, ඒවා අප්‍රමාදව පවතින නීතියේ ප්‍රතිපාදනවලට අනුව විනාශ කිරීමට හෝ අන් ලෙසකින් බැහැර කිරීමට

අවශ්‍ය පියවර අප්‍රමාදව ගත යුතුය. ඒ සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සෑම පලාතකටම අතිරේක මහේස්ත්‍රාත්වරයකු පත් කොට, ඔහුට එම පළාතම විෂයෙහි භෞමික අධිකරණ පාත්‍රතාවය පවරා මාස හයක (06) කාලසීමාවක් ඇතුළත ඉහත සඳහන් කටයුත්ත සිදු කොට අවසාන කිරීමට දන්වන ලෙසට, අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලෙසට නිර්දේශ කරමු.

7. මෙම කමිටුවේ නිර්දේශ බොහෝමයක් මහාධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණවල ක්‍රියාකාරීත්වයට ඍජු ලෙස බලපාන බව කමිටුව නිරීක්ෂණය කරයි. එසේ හෙයින්, මෙම වාර්තාව අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කොට එකී කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරන ලෙස යෝජනා කර සිටිමු.

8. මෙම කමිටුවෙන් යෝජිත නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුව පිළිබඳ ව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගැනීම වස්, මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වැනි පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වන අදාල කාරක සභාවන් වෙතට ඉදිරිපත් කොට, එම කාරක සභාවල නිර්දේශ ලබා ගන්නා ලෙසට නිර්දේශ කරමු.

9. ඉහත සඳහන් පාර්ශ්වයන්වලින් ඔවුන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ ලබා ගැනීමේ දී නිශ්චිත කාලසීමාවක් තුළ දී ඒවා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට දන්වා සිටින ලෙසට ඉල්ලීමක් කරන ලෙසට යෝජනා කර සිටිමු.

10. ඉහත සඳහන් පාර්ශ්වයන්වලින් නිරීක්ෂණ සහ නිර්දේශ ලැබුනහොත් සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට මෙම කමිටුවේ නිර්දේශ පිළිබඳ නිරීක්ෂණ හෝ නඩු භාණ්ඩ කළමනාකරණය සහ බැහැර කිරීම සම්බන්ධයෙන් නිර්දේශ වෙතොත්, ඒවා ඉදිරියේ දී මෙම කමිටුවට ඉදිරිපත් කොට ඒ පිළිබඳ කමිටුවේ අවධානයට යොමු කිරීම උචිත බව කමිටුවේ මතය වේ.

මෙම වාර්තාව කමිටු සාමාජිකයින්ගේ අදහස් හා නිර්දේශ ලබා ගෙන, සියලුදෙනාගේ එකඟත්වයෙන් සකස් කරන ලද්දෙකි.

වර්ෂ 2023 ක් වූ ජූලි මස 12 වන දී ය.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ
කමිටුවේ සභාපති ..............................

ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ප්‍රියන්ත නාවාන මහතා ..............................
නීතිපති දෙපාර්තමේන්තුව (ගරු නීතිපති තුමාගේ පළමු වන නියෝජිත)

ජනාධිපති නීතිඥ කුවේර ද සොයිසා මහතා ..............................

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා ..............................

ජනාධිපති නීතිඥ නෙවිල් අබේරත්න මහතා ..............................

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා ..............................
නීතිපති දෙපාර්තමේන්තුව (ගරු නීතිපති තුමාගේ දෙවන නියෝජිත)

නීතිඥ සංජය ගමයේ මහතා ..............................
(ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිත)

නීතිඥ අමල් ඒ. රන්දෙනිය මහතා ..............................

නීතිඥ චතුර ගල්හේන මහතා ..............................

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ කමල් සිල්වා මහතා ..............................
ශ්‍රී ලංකා පොලීසිය (පොලිස්පති වරයාගේ පළමු වන නියෝජිත)

නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අසංග කරවිට මහතා ..............................
ශ්‍රී ලංකා පොලීසිය (පොලිස්පති වරයාගේ දෙවන නියෝජිත)

ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක සන්ධ්‍යා රාජපක්ෂ මහත්මිය ..............................
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව (ආණ්ඩුවේ රස පරීක්ෂක තුමියගේ නියෝජිත)

සහකාර නීති කෙටුම්පත් සම්පාදක ලංකිකා දයාරත්න මෙනවිය ..........................
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව (නීති කෙටුම්පත් සම්පාදක තුමියගේ නියෝජිත)

සහකාර ලේකම් (නීති) රුවනදිනි කුරුප්පු මහත්මිය ..........................
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කමිටුවේ ලේකම්